# කාර්ය සාධන සහ ගිණුම් වාර්තාව
## செயலாற்றுகை மற்றும் கணக்குகள் அறிக்கை
## PERFORMANCE & ACCOUNTS REPORT




### දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ
### மாவட்ட செயலகம் - கம்பஹா
### District Secretariat - Gampaha

**රාජ්‍ය සේවාලාභී සත්කාරයේ ප්‍රමුඛයා වෙමු ..................................**



2015 වර්ෂයේ ගම්පහ දිස්ත්‍රික්කය වෙත පිරිනැමුනු සංවර්ධන ව්‍යාපෘති ජනතා අපේක්ෂාවන් උපරිමයෙන් මෙන්ම ඵලදායි ලෙස මුදුන්පත්වන අයුරින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා එම කාර්යන්ට අදාල අනෙකුත් රාජ්‍ය ආයතනයන් හරහා ක්‍රියාත්මක කරවීමට හැකි වූ බව ඉතාමත් සතුටින් ප්‍රකාශ කරමි.

මෙම කාර්යයන් ඉටුකිරීමේදී ගම්පහ දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන් දක්වන ලද දායකත්වය ඉතා අගය කොට සලකමි. මෙහිදි ඔවුන්ට ලබා දුන් තාක්ෂණ පුහුණු පාඨමාලාවන් වෙතින් ඔවුන් ලද දැනුම මෙන්ම ඔවුන් වෙත ලබා දී ඇති නවීන මෙවලම් උපරිමවත්, කාර්යක්ෂමව හා ඵලදායි ලෙසත් යොදා ගන්නා ලදී. මේ නිසා ගම්පහ දිස්ත්‍රික්කය ලද ප්‍රතිපාදන අර්ථවත් අයුරින් යොදවාගැනීමට හැකි වූ බව ප්‍රකාශ කරමි.

2015 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලද දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, දිස්ත්‍රික් සැලසුම් කමිටුව, දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව, දිස්ත්‍රික් නිවාස කමිටුව හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ රැස්වීම් හා අනෙකුත් ප්‍රගති සමාලෝචන රැස්වීම මඟින් ගම්පහ දිස්ත්‍රික් දේශපාලන අධිකාරිත්වය හා රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය පවත්වා ගැනීමටත්, සංවර්ධන කටයුතු කඩිනමින් හා ක්‍රමවත්ව ඉටුකිරීමටත් හඳුනා ගන්නා ලද ජනතා අවශ්‍යතාවන් දේශපාලන අධිකාරිත්වය හරහා මධ්‍යම රජය වෙත ලබා දීමටත් හැකි විය.

රාජ්‍ය නිලධාරීන් පිළිබඳව ලැබෙන පැමිණිලි අවම වීම ගම්පහ දිස්ත්‍රික්කයේ රාජ්‍ය නිලධාරීන් ජනතා සේවාවන් සැපයීමේ දී දක්වන උපරිම දායකත්වය හා කැපවීම පිළිබඳ සහතිකයයි. මෙම දායකත්වය " මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක් " යන තේමාව යටතේ යහපත් සමාජයක් උදෙසා අති ගරු ජනාධිපතිතුමාගේ කාර්යසාධන සංරචකයන් වන දේශීය ආහාර නිෂ්පාදන, මත්ද්‍රව්‍ය නිවාරණ, පාරිසර සංරක්ෂණ හා වකුගඩු රෝග නිවාරණ යන ජාතික වැඩසටහන් උපරිමයෙන් සාර්ථක කර ගැනීමට අවශ්‍ය උපරිම දායකත්ව ලබා දීමත් ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සාර්ථකව හා කඩිනමින් නිමා කර ගැනීමට හා පරිපාලන ව්‍යුහය මනාව පවත්වා ගැනීමටත් තවදුරටත් අපේක්ෂා කරමි.



සුනිල් ජයලත්
දිස්ත්‍රික් ලේකම් / දිසාපති - ගම්පහ

## හැඳින්වීම

ගම්පහ දිස්ත්‍රික්කය පරිපාලන දිස්ත්‍රික් පනතේ 3 වන ඡේදය යටතේ 1978 සැප්තැම්බර් මස 07 වන දින ගැසට් නිවේදනය මඟින් නව දිස්ත්‍රික්කයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබුණි. මෙය කොළඹ දිස්ත්‍රික්කය නැවත බෙදීමෙන් වෙන්කරන ලද පාලන ප්‍රදේශයකි. ගම්පහ බැන්ඩියමුල්ල ප්‍රදේශයේ අග්‍රා ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන යනු ලබන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මූලස්ථානය කොටගත් උතුරින් මා ඔයෙන්ද (කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක) නැගෙනහිරින් මීටර 100-200 උසකින්ද විහිදී යන වැටි හා නිම්න වලින් ද (කෑගල්ල දිස්ත්‍රික්කය) දකුණින් කැලණි ගඟ මායිම් වන කොළඹ දිස්ත්‍රික්කයෙන්ද, බටහිර ඉන්දියන් සාගරයෙන්ද, මායිම් වූ කිලෝ මීටර 45 දිගින් හා පළලින් යුත් හතරැස් බිම් කඩක් වශයෙන් පිහිටා ඇත.

නැගෙනහිර සියනෑ කෝරළය, බටහිර සියනෑ කෝරළය, අළුත්කූරු කෝරළය, දකුණු අළුත්කූරු කෝරළය හා හාපිටිගම් කෝරළය යන කෝරළ පහෙන් ගම්පහ දිස්ත්‍රික්කය සමන්විත වේ. ගම්පහ යන ස්ථානීය නාමය මැදගම, ඉහළගම, පහළගම, හෙනරත්ගොඩ සහ අළුත්ගම එකතු කිරීමෙන් භාවිතයට පත් වූ බව ප්‍රකට වී ඇත. සංස්කෘතික, දේශපාලන හා අධ්‍යාපනික ක්ෂේත්‍රයන්හි ගම්පහ දිස්ත්‍රික්කයට අද්විතීය ස්ථානයක් හිමි වෙයි. දිවයිනේ අග නගරය හා ජාත්‍යන්තර වරායට මුවදොර පිහිටි ගම්පහ දිස්ත්‍රික්කය නිෂ්පාදන කර්මාන්ත කේන්ද්‍ර කරගත් නිදහස් වෙළඳ කලාප, සංචාරක ව්‍යාපාරය සම්බන්ධව ද ජාත්‍යන්තර ගුවන් තොටුපල, දුම්රිය හා මහාමාර්ග මෙන්ම විදුලි බලය හා දුරකථන වැනි යටිතල පහසුකම් අතින් ද විශේෂ වැදගත් කමක් උසුලයි.

ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය වර්ග කිලෝමීටර 1,387 (හෙක්ටයාර 139,140) භූමි ප්‍රමාණයකින් යුක්ත වන අතර කොළඹ දිස්ත්‍රික්කය මෙන් දෙගුණයක විශාලත්වයක් දරයි. බස්නාහිර පළාතේ මුළු බිම් ප්‍රමාණයෙන් 38% හා ශ්‍රී ලංකා භූමි ප්‍රමාණයෙන් 2.1% ආවරණය වේ. උතුරු අක්ෂාංශ 6°54”5 සහ 7°20 අතර හා නැගෙනහිර දේශාංශ 79°48.75 සහ 80°13 අතර පිහිටා ඇත.

ගම්පහ දිස්ත්‍රික්කය 21.6°C අවම උෂ්ණත්වයකින් ද 37°C උපරිම උෂ්ණත්වයකින් ද මිලි මීටර් 1,750 පමණ වූ සාමාන්‍ය වර්ෂාපතනයකින්ද (හෙනරත්ගොඩ 2,477 මිලි මීටර්) යුතු උෂ්ණ තෙත් කලාපීය දේශගුණයක් විදහාපාන භූමි ප්‍රදේශයකි. වැසි ලැබෙන්නේ අන්තර් මෝසම් සුළඟ සහිත කාල පරිච්ඡේදයේ හා නිරිත දිග මෝසම් සුලං කාලයේදීය. ජනවාරි සිට අප්‍රියෙල් මාස අතර කාලය දිස්ත්‍රික්කය පුරා වියළි දේශගුණයක් පවතී.

ගම්පහ දිස්ත්‍රික්කයේ දක්නට ලැබෙන උෂ්ණ තෙත් දේශගුණික තත්වයන් මත තෙත් කලාපීය වෘක්ෂලතා ලක්ෂණ ඇති වණ ප්‍රදේශ හා වගුරු බිම් ආශ්‍රිත කඩොලාන වනාන්තර දැකිය හැක.

# පටුන


| | | |
|---|---|---|
| | | පිටුව |
| **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය** | | **01 - 36** |
| 1.1. | දැක්ම, මෙහෙවර, කාර්යභාරය | 01 |
| 1.2. | ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් විශාලත්වය, ග්‍රාම නිලධාරි වසම්, ගම්මාන සංඛ්‍යාව, ජනගහනය | 02 |
| 1.3. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 2015.12.31 දිනට | 03 |
| 1.4. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති ක්ෂේත්‍ර නිලධාරීන් | 04 |
| 1.5. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් කාර්යය මණ්ඩලය | 05 |
| 1.6. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පාලන අංශයෙන් ඉටුකරනු ලබන කාර්යයන් | 06 |
| 1.7. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයෙන් ඉටුකරනු ලබන කාර්යයන් | 06 |
| 1.8. | මානව සම්පත් සංවර්ධනය/ පුහුණු වැඩසටහන් | 07 |
| 1.9. | දිස්ත්‍රික් නිපුණතා ප්‍රවර්ධන ඒකකය | 08 - 09 |
| 1.10. | ණය සම්බන්ධ කටයුතු / කාර්ය මණ්ඩල සඳහා ණය නිකුත් කිරීම | 10 |
| 1.11. | ස්වේච්ඡා සංවිධාන හා රාජ්‍යනොවන සංවිධාන ලියාපදිංචි කිරීම | 10 |
| 1.12. | ගිනි අවි බලපත්‍ර | 11 |
| 1.13. | විස්තීරණ ආපදා වැඩසටහන, නිවාස හානි | 12 |
| 1.14. | සමාජසේවා කටයුතු | 13 - 19 |
| 1.15. | වෘත්තිය මාර්ගෝපදේශ වැඩසටහන් | 20 - 22 |
| 1.16. | ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් | 23 - 24 |
| 1.17. | ක්‍රීඩා කටයුතු | 25 - 26 |
| 1.18. | ළමා හිමිකම් ප්‍රවර්ධන අංශය | 27 - 28 |
| 1.19. | මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් | 29 - 30 |
| 1.20. | දිස්ත්‍රික් ළමාරක්ෂක අධිකාරිය | 31 |
| 1.21. | සංස්කෘතික අංශය | 32 – 33 |
| 1.22. | බෞද්ධ කටයුතු අංශය | 34 - 36 |
| **2.** | **පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර අංශය** | **37 – 40** |

| | | |
|---|---|---|
| **3.** | **දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය** | **41 - 47** |
| 3.1 | දින 100 විශේෂ සංවර්ධන වැඩසටහනට ගම් නගා සිටුවීම - 2015 | 41 – 44 |
| 3.2 | ග්‍රාමීය ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම - 2015 | 44 |
| 3.3 | දත්ත හා තොරතුරු | 44 |
| 3.4 | අවිච්ඡේද වැඩසටහන - ගම්පහ දිස්ත්‍රික්කය - 2015 | 45 |
| 3.5 | ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම | 46 |
| 3.6 | ගම්පහ දිස්ත්‍රික් ඒකාබද්ධ වාර්ෂික ක්‍රියාත්මක වැඩසටහන | 46 - 47 |
| **4.** | **දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය** | **48 - 60** |
| 4.1 | ජීවනෝපාය සංවර්ධන වැඩසටහන | 48 |
| 4.2 | දිරිය පියස නිවාස වැඩසටහන | 48 |
| 4.3 | දිවිනැගුම වැඩසටහන 2015 | 49 |
| 4.4 | සමෘද්ධි බැංකු වැඩසටහන | 49 – 50 |
| 4.5 | දත්ත ආකෘතීන් | 51 - 60 |
| **5.** | **දිස්ත්‍රික් මෝටර් රථ ප්‍රවාහන කාර්යාලය** | **61 - 64** |
| **6.** | **සංඛ්‍යාලේඛන අංශය** | **65 - 69** |
| **7.** | **දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය** | **70 - 76** |
| **8.** | **කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය** | **77 - 80** |
| **9.** | **ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය** | **81 - 83** |
| **10.** | **පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය** | **84 - 86** |
| **11.** | **කෘෂිකර්මය** | **87 - 96** |
| 11.1 | දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය | 87 - 89 |
| 11.2 | නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ( ව්‍යාපෘති ) කාර්යාලය | 90 - 92 |
| 11.3 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 93 - 96 |
| **12.** | **දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය** | **97 – 101** |
| **13.** | **ගිණුම්** | **102 – 108** |

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 1.1 දැක්ම, මෙහෙවර, කාර්යභාරය

**දැක්ම**

රාජ්‍ය සේවාලාභී සත්කාරයේ ප්‍රමුඛයා වීම.

මෙහෙවර

**රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව ඵලදායී සම්පත් කළමනාකරණයක් තුළින් කාර්යක්ෂම පරිපාලන ව්‍යුහයක් බිහිකර ගම්පහ දිස්ත්‍රික්කය තිරසාර සංවර්ධනයක් කරා මෙහෙයවීම**

**කාර්යභාරය**

රාජ්‍ය ප්‍රතිපත්තීන් වලට අනුකූල වෙමින් මනා කළමනාකාරීත්වය තුළින් ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමේ ජනතාවගේ අපේක්ෂාවන් මල්ඵල ගන්වමින් ජනතාවාදී රාජ්‍ය සේවයක් ගොඩනැංවීම

## 1.2 ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් විශාලත්වය, ග්‍රාම නිලධාරි වසම්, ගම්මාන සංඛ්‍යාව හා ජනගහනය




| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | විශාලත්වය වර්ග කි.මී | ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව | ගම් සංඛ්‍යාව | ජනගහනය **2001** | ජනගහනය **2012** | නිවාස ඒකක සංඛ්‍යාව **2013** |
|---|---|---|---|---|---|---|
| අත්තනගල්ල | 154.0 | 151 | 191 | 154,967 | 179,565 | 44,869 |
| බියගම | 61.6 | 49 | 61 | 161,300 | 186,585 | 47,636 |
| දොම්පෙ | 178.3 | 133 | 176 | 130,021 | 154,005 | 39,175 |
| දිවුලපිටිය | 202.3 | 123 | 227 | 128,048 | 144,506 | 38,580 |
| ගම්පහ | 95.7 | 101 | 148 | 171,040 | 197,667 | 50,723 |
| ජා ඇල | 64 | 57 | 101 | 184,666 | 201,521 | 51,736 |
| කටාන | 107.6 | 79 | 131 | 222,683 | 235,291 | 69,375 |
| කැලණිය | 21.9 | 37 | 47 | 134,364 | 137,339 | 32,584 |
| මහර | 98.8 | 92 | 108 | 176,870 | 207,782 | 52,191 |
| මිනුවන්ගොඩ | 130.5 | 121 | 192 | 151,661 | 178,331 | 46,396 |
| මීරිගම | 186.6 | 149 | 273 | 143,663 | 164,580 | 42,462 |
| මීගමුව | 30.8 | 39 | 50 | 144,274 | 142,136 | 34,040 |
| වත්තල | 54.6 | 46 | 105 | 160,127 | 175,525 | 42,297 |
| එකතුව | **1386.7** | **1177** | **1810** | **2,063,684** | **2,304,833** | **592,064** |

**2014 වර්ෂයේ ගම්පහ දිස්ත්‍රික්කයේ වර්ෂ මැදි ජනගහනය 2,304,833කි.**

මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය.

## 1.3 ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-අනුමත කාර්ය මණ්ඩලය - 2015.12.31 දිනට

| | තනතුර | ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සේවයේ යෙදී සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | දිස්ත්‍රික් ලේකම් ( ශ්‍රී.ලං.ප.සේ. ) | විශේෂ ශ්‍රේණිය | 01 | 01 | - |
| 2 | අතිරේක දිස්ත්‍රික් ලේකම් ( ශ්‍රී.ලං.ප.සේ. ) | 1 | 02 | 01 | - |
| 3 | සහකාර දිස්ත්‍රික් ලේකම් ( ශ්‍රී.ලං.ප.සේ. ) | 111 | 01 | 01 | - |
| 4 | ප්‍රධාන ගණකාධිකාරී ( ශ්‍රී.ලං.ග.සේ. ) | 1 | 01 | 01 | - |
| 5 | ගණකාධිකාරී ( ශ්‍රී.ලං.ග.සේ. ) | | 01 | 01 | - |
| 6 | ඉංජිනේරු ( ශ්‍රී.ලං.ඉ.සේ. ) | 111 | 01 | 01 | - |
| 7 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 01 | 01 | - |
| 8 | පරිපාලන නිලධාරී | රා.කළ.ස. අධි. | 01 | - | 01 |
| 9 | භාෂා පරිවර්තක | 1 | 01 | 01 | - |
| 10 | අයවැය සහකාර | | 02 | 02 | - |
| 11 | සංවර්ධන සම්බන්ධීකාරක | | 02 | 02 | - |
| 12 | සංවර්ධන නිලධාරී | 111 | 38 | 16 | 22 |
| 13 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 1/11/111 | 25 | 25 | - |
| 14 | සැලසුම් ශිල්පී | 111 | 01 | 01 | - |
| 15 | ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර | 111 | 02 | 02 | - |
| 16 | කාර්මික නිලධාරී | | 01 | 01 | - |
| 17 | තාක්ෂණ සහකාර | 111 | 01 | 01 | - |
| 18 | පිළිගැනීමේ නිලධාරී | | 01 | - | 01 |
| 19 | කාර්යාල සේවක සේවය | 1/11/111 | 10 | 09 | 01 |
| 20 | රියදුරු සේවය | 1/11/111 | 07 | 07 | - |
| | එකතුව | | **99** | **74** | **25** |

## 1.4 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත ක්ෂේත්‍ර නිලධාරීන් 2015.12.31 දිනට

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක | 01 |
| කෘෂිකර්ම අධ්‍යක්ෂක | 01 |
| සහකාර අධ්‍යක්ෂක (පොහොර) | 02 |
| බෞද්ධ කටයුතු සමායෝජක | 02 |
| මානව සම්පත් සංවර්ධන සහකාර | 08 |
| භාෂා පරිවර්තක සහකාර | 01 |
| සමථ පුහුණු නිලධාරි | - |
| විශ්‍රාම වැටුප් නිලධාරි | - |
| සංස්කෘතික සංවර්ධන සහකාර | 02 |
| පුවත්පත් නිලධාරි | 03 |
| සමාජසේවා නිලධාරි | 02 |
| ඵලදායිතා ප්‍රවර්ධන නිලධාරී | 02 |
| ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර | 01 |
| විද්‍යා හා තාක්ෂණ නිලධාරි | - |
| සහකාර දිස්ත්‍රික් මනෝ සම්බන්ධීකාරක | - |
| වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී | 03 |
| සමාජ සංවර්ධන සහකාර | 01 |
| මුල් ළමාවිය සංවර්ධන සහකාර | 01 |
| ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි | 01 |
| ළමාරක්ෂක නිලධාරි | 03 |
| උපදේශන නිලධාරි | 01 |
| සංවර්ධන නිලධාරි (රාජ්‍ය නොවන සංවිධාන) | 01 |
| සංවර්ධන නිලධාරි ( ආපදා සහන සේවා) | 01 |
| සංවර්ධන නිලධාරි( දිස්ත්‍රික් සම්බන්ධීකරණ) | 01 |
| දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි | 04 |
| වනිතා සංවර්ධන නිලධාරී | - |
| සංවර්ධන නිලධාරි ( විදේශ සේවා ) | 01 |
| ස්ථාන භාර නිලධාරී සමාජ සේවා | 01 |

## 1.5 ගම්පහ දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි සේවක සංඛ්‍යා තොරතුරු - 2015.12.31 දිනට

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | අත්තනගල්ල | බියගම | දිවුලපිටිය | දොම්පෙ | ගම්පහ | ජාඇල | කටාන | කැලණිය | මහර | මීනුවන්ගොඩ | මීරිගම | මීගමුව | වත්තල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් | | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 13 |
| සහකාර ප්‍රාදේශීය ලේකම් | | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 13 |
| ගණකාධිකාරී | | 1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 12 |
| පරිපාලන නිලධාරි (අධිපන්තිය) | | 1 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 08 |
| පරිපාලන ග්‍රාම නිලධාරි | | 0 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 09 |
| සංවර්ධන නිලධාරි | | 11 | 6 | 5 | 12 | 13 | 8 | 5 | 11 | 10 | 9 | 10 | 11 | 12 | 123 |
| රාජ්‍යකළමනාකරණ සහකාර | අනුමත | 36 | 25 | 37 | 32 | 44 | 33 | 31 | 29 | 31 | 34 | 33 | 30 | 26 | 421 |
| | දැනට සිටින | 35 | 25 | 34 | 32 | 41 | 34 | 30 | 29 | 28 | 34 | 34 | 30 | 26 | 412 |
| | පුරප්පාඩු | 1 | 0 | 0 | 0 | 3 | 0 | 1 | 0 | 3 | 0 | 0 | 0 | 0 | 8 |
| තාක්ෂණ නිලධාරි | | 1 | 1 | 1 | 2 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 2 | 15 |
| පරිගණක දත්ත ක්‍රියාකරු | | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 11 |
| රියදුරු | | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 26 |
| කාර්යාල කාර්ය සහායක | | 6 | 4 | 5 | 7 | 4 | 7 | 5 | 5 | 6 | 4 | 5 | 5 | 4 | 67 |
| සනීපාරක්ෂක කම්කරු | | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |

## 1.6 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පාලන අංශයෙන් ඉටු කරනු ලබන කාර්යයන්

2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ කාර්ය මණ්ඩලයේ අභ්‍යන්තර පරිපාලනය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ට අදාලව පාලන කටයුතු මෙහෙයවීම.
3. කෘෂිකර්ම කමිටුව, පාරිසරික නීති ක්‍රියාත්මක කිරීමේ ආරක්ෂිත කමිටුව, ධීවර කමිටුව, අබිං කමිටුව, නිවාස කමිටුව වැනි රැස්වීම් පැවැත්වීම සහ අනෙකුත් රාජ්‍ය ආයතන හා සම්බන්ධීකරණ කටයුතු කිරීම.
4. විවිධ රාජ්‍ය සහ ආගමික උත්සව පැවැත්වීම.
5. කාර්ය මණ්ඩල පුහුණුව.
6. මහජනයාගෙන් සෘජුවම ලැබෙන පැමිණිලි, පෙත්සම්, දුක්ගැනවිලි ආදිය පිළිබඳව පරීක්ෂාකිරීම සහ අදාල අංශවලට යොමුකිරීම.
7. තුවක්කු ආඥා පනත යටතේ ගිනි අවි බලපත්‍ර ඉල්ලීම් පිළිබඳ කටයුතු, වාර්ෂිකව ගිනි අවි බලපත්‍ර අළුත් කිරීම.
8. අන්තරාදායක ඖෂධ පාලන පනත යටතේ කටයුතු කිරීම.
9. පුපුරණ ද්‍රව්‍ය සඳහා බලපත්‍ර ලබාදීම සහ ආරක්ෂක සේවා සපයන ආයතන ලියාපදිංචි කිරීම.

## 1.7 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයෙන් ඉටු කරනු ලබන කාර්යයන්

1. වාර්ෂික ආදායම් සහ වියදම් ඇස්තමේන්තු සකස් කිරීම.
2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම, වියදම් කළමනාකරණය හා මූල්‍ය කටයුතු මෙහෙයවීම.
3. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අක්මුදල් සැපයීම, අක්මුදල් පාලනය හා අවශ්‍ය තොරතුරු ලබාගැනීම.
4. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අවශ්‍ය ගබඩා ද්‍රව්‍ය හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඇණවුම් කිරීම, නිකුත් කිරීම හා ගබඩා පාලනය
5. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මාසික ගිණුම් සාරාංශ ලබාගෙන ඒකාබද්ධ කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.
6. රේඛීය අමාත්‍යාංශවලට ගිණුම් ප්‍රකාශන හා වාර්තා ඉදිරිපත් කිරීම.
7. වාර්ෂික විසර්ජන ගිණුම, අත්තිකාරම් ගිණුම හා වාර්ෂික තැන්පත් පාලන ගිණුම පිළියෙල කිරීම හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, භාණ්ඩාගාරය හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
8. ආදායම් එකතු කිරීම, ගිණුම් තැබීම හා ආදායම් ගිණුම් වලට අවශ්‍ය කෙරෙන තොරතුරු ආදායම් ගණන් දීමේ නිලධාරියා වෙත ලබා දීම.
9. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විගණන විමසුම් වලට පිළිතුරු ලබාගෙන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
10. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම, ඒ අනුව ක්‍රියාකාරී සැලැස්මට අදාල තොරතුරු ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම.

දිස්ත්‍රික්කයේ පරිපාලන හා සම්බන්ධීකරණ ප්‍රධාන ආයතනය ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කරයි. මහජනතාව හා රාජ්‍ය ආයතන සමග සෘජු සබඳතාවයකින් යුතුව කටයුතු කර උපරිම සේවාවක් සැලසීම පිණිස ක්‍රියාකර ඇත.

## 1.8 මානව සම්පත් සංවර්ධනය / පුහුණු වැඩසටහන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා පහත දැක්වෙන පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

| පාඨමාලාව | පුහුණු මධ්‍යස්ථානය | පුහුණු දින ගණන | සහභාගී වූ ගණන | අනුග්‍රහය | තනතුර | වියදම |
|---|---|---|---|---|---|---|
| කාර්යාල කාර්ය සේවයේ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය පිළිබඳ පුහුණු පාඨමාලාව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 02 | 34 | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | කාර්යාල කාර්ය සේවයේ නිලධාරීන් | රු. 27280/= |
| සේවාරම්භක පුහුණු පාඨමාලාව | ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 10 | 160 | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නවක නිලධාරීන් | රු. 256220/= |
| සේවාරම්භක පුහුණු පාඨමාලාව | මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 10 | 141 | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නවක නිලධාරීන් | රු. 222090/= |
| ග්‍රාම නිලධාරී පුහුණු වැඩසටහන | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 10 | 20 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | නවක ග්‍රාම නිලධාරීන් | රු. 107500/= |

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත යොමු කර ලබා දුන් පුහුණු වැඩසටහන්

| පාඨමාලාව | පුහුණු මධ්‍යස්ථානය | පුහුණු දින ගණන | සහභාගී වූ ගණන | තනතුර |
|---|---|---|---|---|
| වැටුප් පරිවර්තනය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 02 | 01 | උපාධිධාරීන්/ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් |
| විනය කාර්ය පටිපාටිය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 05 | 01 | සහකාර දිස්ත්‍රික් ලේකම් |
| සේවාරම්භක පුහුණු පාඨමාලාව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 18 | 21 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නවක නිලධාරීන් |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 1.9 දිස්ත්‍රික් නිපුණතා ප්‍රවර්ධන ඒකකය

<u>දැක්ම</u>

ගම්පහ දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන්ට වඩාත් ඵලදායී පුහුණු වැඩමුළු ලබාදීම මගින් විශිෂ්ඨතම හා සාර්ථකම නිපුණතා ප්රවර්ධන ඒකකය බවට පත් වීම.

<u>මෙහෙවර</u>

කාර්යක්ෂම ඵලදායී ගුණාත්මක සේවාවක් ගම්පහ දිස්ත්‍රික් ජනතාවට ලබා දීම සඳහා කැප වූ නිපුනතා වලින් පරිපූර්ණ වූ රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම.

<u>පාඨමාලා අන්තර්ගතය</u>

මෙම ඒකකය මගින් පාඨමාලා හතරක් පවත්වනු ලබයි.

1. මූලික පරිගණක කුසලතා - පරිගණක මෙහෙයුම් පද්ධතිය, දෘඩාංග සහ වදන් සැකසුම (Word)පිළිබඳ මූලික දැනුම.
2. අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල - (Internet and Email) අන්තර් ජාලය හා විද්‍යුත් තැපැල භාවිතය හඳුන්වාදීම.
3. පැතුරුම් පත් (MS Excel) - Work book, සමීකරණ (formulas), ශ්‍රිත (functions), ප්‍රස්ථාර සැකසීම (charts and graphs), මැක්‍රො භාවිතය(macros and modules) පිලිබඳ මූලික දැනුම.
4. දත්ත සමූහය (MS Access) - දත්ත සමුදාය (Databases), RDBMS, Basic elements, වාර්ථා ලබා ගැනීම (Queries), forms, modules හඳුන්වාදීම.

**පුහුණුව අවසන් කළ කණ්ඩායම් වල සාරාංශය**

| පාඨමාලාවේ නම | සම්පූර්ණ කරන ලද කණ්ඩායම් | දින සංඛ්‍යාව | දරණ ලද මුළු වියදම රු. |
|---|---|---|---|
| මූලික පරිගණක කුසලතා | 10 | 5 | 398,999.00 |

**සහභාගී වන්නන් පුහුණු වැඩ සටහන මගින් ලබාගන්නා ප්‍රතිලාභ**

- රාජ්‍ය සේවයයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාවය වර්ධනය කිරීම.
- පරිගණක මත පදනම් වූ ක්‍රම සම්බන්ධ කැමැත්ත / අන්තර්ග්‍රහණය වැඩි කිරිම.
- තොරතුරු වල නිවැරදිතාවය හා විනිවිදභාවය වැඩිදියුණු කිරිම.

**2015 වර්ෂයේ අයදුම්පත් සංඛ්‍යාව සහ සහභාගීවූවන් සංඛ්‍යාව**

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | සහභාගී වූ ගණන |
|---|---|
| අත්තනගල්ල | 42 |
| බියගම | 14 |
| දිවුලපිටිය | 28 |
| දොම්පේ | 38 |
| ගම්පහ | 24 |
| ජා-ඇල | 10 |
| කටාන | 11 |
| කැලණිය | 11 |
| මහර | 20 |
| මීනුවන්ගොඩ | 35 |
| මීරිගම | 42 |
| මීගමුව | 9 |
| වත්තල | 2 |
| කච්චේරි | - |
| **එකතුව** | **286** |



## 1.10 ණය සම්බන්ධ කටයුතු / කාර්ය මණ්ඩල සඳහා ණය නිකුත් කිරීම

**<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් සඳහා නිකුත් කළ ණය</u>**

| ණය වර්ගය | සංඛ්‍යාව | වටිනාකම (රුපියල්) |
|---|---|---|
| ආපදා ණය | 23 | 1,533,354.00 |
| පාපැදි ණය | 04 | 24,000.00 |
| ණයබරින් මිදීමේ ණය | - | - |
| දේපල ණය | 1 | 1,000,000.00 |
| **එකතුව** | **28** | **2,557,354.00** |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 01.11 ස්වේච්ඡා සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශ කිහිපයක ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන / ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම පහත පරිදි සිදු කරන ලදී.

| ලියාපදිංචි කළ ආයතන වර්ගය | වර්ෂය මුල තිබූ ගණන | වර්ෂය තුළ නව ලියාපදිංචි කිරීම | වර්ෂය අග එකතුව |
|---|---|---|---|
| ස්වේච්ඡා සංවිධාන | 31 | 01 | 32 |
| රාජ්‍ය නොවන සංවිධාන | 33 | 01 | 34 |

## 01.12 ගිනිඅවි බලපත්‍ර

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙම අංශය මඟින් ගිනිඅවි බලපත්‍ර අළුත් කිරීම හා එම බලපත්‍ර අස්ථානගත වූ විට ඒවෙනුවට තාවකාලික බල පත්‍ර නිකුත් කිරීම , කෘෂිකාර්මික කටයුතු සඳහා ගිනිඅවි බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම් පත්‍ර නිකුත් කිරීම හා ගිනිඅවි අයදුම් පත්‍ර සඳහා දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය ලබාදීම, මුරකරු බලපත්‍ර නිකුත් කිරීම , නැවත රජයට භාරදෙන ගිනිඅවි භාර ගැනීම හා එම ගිනිඅවි තක්සේරු කර විකිණීම සිදු කරනු ලැබේ. එසේම ගිනිඅවි බලපත්‍ර පැවරීම සඳහා අයදුම් පත්‍ර නිකුත් කිරීම හා අධිකාරිත්වය වෙනස් කිරීමට අවශ්‍ය නිර්දේශයන් ලබා දීම ද සිදු කරනු ලබයි.

<u>ගම්පහ දිස්ත්‍රික්කයේ ඇති ගිනිඅවි පිළිබඳ තොරතුරු සාරාංශය - 2015</u>

| ගිනිඅවි ලබා දී ඇති අවශ්‍යතාවය | සංඛ්‍යාව |
|---|---|
| කෘෂිකාර්මික කටයුතු | 1716 |
| කෘෂිකාර්මික නොවන කටයුතු | 240 |
| බැංකු ආරක්ෂක කටයුතු | 255 |
| රාජ්‍ය ආයතන ආරක්ෂක කටයුතු | 283 |
| පෞද්ගලික ආරක්ෂක සේවා ආයතන | 39 |
| පෞද්ගලික ආයතන සේවා කටයුතු | 16 |
| රයිෆල් | 18 |
| දිස්ත්‍රික්කයේ ඇති මුළු ගිනිඅවි සංඛ්‍යාව | 2567 |

මූලාශ්‍රය : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පාලන අංශය

ගිනිඅවි බලපත්‍ර අළුත් කිරීමෙන් ලද ආදායම - රු: 3,15200.00

ගිනිඅවි විකිණීමෙන් ලද ආදායම - රු: 3,19500.00

නව ගිනිඅවි බලපත්‍ර සඳහා අයදුම් පත්‍ර ලබා දීමෙන් ලද ආදායම - රු: 790.00

මුරකරු බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම - රු:3900.00

තාවකාලික බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම - රු: 110.00

2015 වර්ෂයේ මුළු ආදායම - රු: 6,39500.00

## 01.13 විස්තීර්ණ ආපදා වැඩ සටහන, නිවාස හානි

2015 වර්ෂයේ විස්තීර්ණ හා සුළු ආපදා තත්ත්වයන් හිදී ලබා දුන් සහනාධාර පිළිබඳ විස්තර වාර්තාව

ආපදාවට ලක් වූ සඳහා ලබා දුන් සහනාධාර මුදල රු. 4,147,568.00

| | | 2014 වර්ෂයේ සිදු වූ නිවාස හානි සඳහා 2015 ලබා දුන් ප්‍රතිපාදන | | 2015 විස්තීර්ණ හා සුළු ආපදා වැය කල මුදල් | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | පූර්ණ හානි | | පිසූ ආහාර | වියලි සලාක | අවමගල්‍ය කටයුතු | පරිපාලන වියදම් | |
| අනුඅංකය | ප්‍රා.ලේ.කොට්ඨාශ | සංඛ්‍යාව | මුදල | | | | | |
| | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | | | | | | 6500 | 6500 |
| 1 | කැළණිය | 2 | 150000 | | | | | 150000 |
| 2 | මීගමුව | | | | 52200 | | 6750 | 58950 |
| 3 | මිනුවන්ගොඩ | 1 | 50000 | | | 30000 | | 80000 |
| 4 | කටාන | | | 78241 | | | 21250 | 99491 |
| 5 | අත්තනගල්ල | 4 | 350000 | | | | | 350000 |
| 6 | වත්තල | 1 | 50000 | 341948 | | 15000 | 11000 | 417948 |
| 7 | ගම්පහ | 1 | 100000 | 17079 | | | 700 | 117779 |
| 8 | මීරිගම | 10 | 830000 | 6900 | | | | 836900 |
| 9 | ජා-ඇල | 1 | 30000 | | | | | 30000 |
| | එකතුව | 20 | 1560000 | 444168 | 52200 | 45000 | 46200 | 2147568 |

* 2014 හා 2015 වර්ෂවල සිදු වූ නිවාස හානි සඳහා ප්‍රතිපාදන ලබා තවදුරටත් දීමට ඇත.

2015 වර්ෂයේ ජාතික සුරක්ෂිත දිනයට සමගාමීව ඕමාන් රජයේ ආධාර යටතේ ආපදාවට ඔරොත්තු දෙන නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ඉදිකල නිවාස සංඛ්‍යාව 04 ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය 2,000,000.00

| ප්‍රාදේශිය ලේකම් කාර්යාල | නිවාස ගණන | ලබා දුන් ප්‍රතිපාදන මුදල |
|---|---|---|
| මිනුවන්ගොඩ | 1 | 500000 |
| අත්තනගල්ල | 1 | 500000 |
| මීරිගම | 2 | 1000000 |
| එකතුව | 4 | 2000000 |

## 01.14 සමාජසේවා කටයුතු

### ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන සේවා

| | ව්‍යාපෘතිය | ප්‍රතිපාදන මුදල රු. |
|---|---|---|
| 1 | මාසික ආදායම රු.6000.00ට වඩා අඩු, තමන්ගේ ම ඉඩමක් සහිත අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන් සඳහා ක්‍රියාත්මක කරනුලබන නිවාස ආධාර වැඩසටහන. | 1,828,000.00 |
| 2 | ආබාධ සහිත තැනැත්තන් සඳහා ස්වයං රැකියා ආධාර වැඩසටහන. | 420,010.00 |
| 3 | වෛද්‍යාධාර ලබාදීම | 417,943.00 |
| 4 | ආබාධ සහිත පුද්ගලයන්ගේ කුසලතා සංවර්ධනය සඳහා ස්වශක්ති සංවිධාන හා සාමාජිකයන් ඇගයීම. | 64,000.00 |
| 5 | දිරිය අත්වැල ස්වයං රැකියා පුහුණු වැඩ සටහන | 155,400.00 |
| 6 | ප්‍රජා මූලික ආබාධිත පුනරුත්ථාපන වැඩසටහන 2015 | 600,000.00 |
| 7 | මහින්ද චින්තන වැඩසටහන යටතේ ආබාධ සහිත පුද්ගලයන් සඳහා රු.3000.00 මාසික ජීවන ආධාර ලබාදීම. | 78,885,000.00 |

### තනි මාපිය පවුල් පුනරුත්ථාපන වැඩසටහන

පාසල් යන දරුවන් සහිත අඩු ආදායම්ලාභී වැන්දඹු කාන්තා/පිරිමි සඳහා ක්‍රියාත්මක මෙම ස්වයං රැකියා වැඩසටහන සඳහා පහත සඳහන් පරිදි මුදල් ලබා දී ඇත.

| ප්‍රා.ලේ.කොට්ඨාශය | පුද්ගල සංඛ්‍යාව | වෙන්කළ මුදල රු. |
|---|---|---|
| දිවුලපිටිය | 05 | 52000.00 |
| මහර | 01 | 15000.00 |
| බියගම | 08 | 110000.00 |
| අත්තනගල්ල | 07 | 100300.00 |
| මිනුවන්ගොඩ | 06 | 81250.00 |
| මීගමුව | 10 | 200000.00 |
| දොම්පෙ | 16 | 235825.00 |
| කටාන | 09 | 92000.00 |
| ජා ඇල | 06 | 79000.00 |
| **එකතුව** | **68** | **536000.00** |

### අක්ෂි කාච ලබාදීම

| ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය | දොම්පෙ | බියගම | කැලණිය | මහර | වත්තල | ජා ඇල | මීගමුව | දිවුලපිටිය | මිනුවන්ගොඩ | මීරිගම | කටාන | අත්තනගල්ල | ගම්පහ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අක්ෂි කාච සංඛ්‍යාව | **42** | **58** | **23** | **10** | **114** | **73** | **102** | **86** | **90** | **23** | **59** | **37** | **49** | **766** |

**ආබාධ සහිත සිසුන් සඳහා අධ්‍යාපන උපකරණ ලබාගැනීම සඳහා ආධාර ලබාදීම.**

| ප්‍රා.ලේ.කොට්ඨාශය | ආබාධ සහිත සිසුන් සංඛ්‍යාව | වෙන්කළ මුදල රු. |
|---|---|---|
| ගම්පහ | 30 | 45000.00 |
| අත්තනගල්ල | 22 | 33000.00 |
| දොම්පෙ | 38 | 120100.00 |
| බියගම | 18 | 27000.00 |
| කැලණිය | 09 | 13500.00 |
| මහර | 12 | 18000.00 |
| වත්තල | - | - |
| ජා ඇල | 29 | 43500.00 |
| මීගමුව | 07 | 10500.00 |
| දිවුලපිටිය | 29 | 43500.00 |
| මිනුවන්ගොඩ | 51 | 76500.00 |
| මීරිගම | 40 | 60000.00 |
| කටාන | 08 | 12000.00 |
| එකතුව | 290 | 435000.00 |

**වෘත්තීය පුහුණුව නිමකළ අභ්‍යාස ලාභීන් වෙනුවෙන් වෘත්තීය මෙවලම් කට්ටල ලබාදීම**

| අනු අංකය | ප්‍රා.ලේ.කොට්ඨාශය | අභ්‍යාසලාභීන් සංඛ්‍යාව | මුදල රුපියල් |
|---|---|---|---|
| 1 | මහර | 02 | 12097.75 |
| 2 | අත්තනගල්ල | 01 | 15000.00 |
| 3 | ගම්පහ | - | - |
| 4 | දොම්පේ | | |
| 5 | ජා ඇල | 02 | 29626.00 |
| 6 | දිවුලපිටිය | 05 | 67795.00 |
| 7 | මිනුවන්ගොඩ | 01 | 14765.00 |
| 8 | කටාන | 06 | 90000.00 |
| 9 | මීරිගම | 02 | 30000.00 |
| | එකතුව | 19 | 259283.75 |

## ආබාධ සහිත පුද්ගලයන් සඳහා සපයන අනෙකුත් සේවා

| ප්‍රා.ලේ.කොට්ඨාශය | අත්වාරු | ශ්‍රවන උපකරණ | ඇස් කන්ණාඩි | රෝදපුටු | ත්‍රෛසිකල් | කිහිලිකරු |
|---|---|---|---|---|---|---|
| මහර | - | 20 | 25 | 03 | 01 | - |
| අත්තනගල්ල | 02 | - | - | - | - | - |
| ගම්පහ | - | 01 | | 11 | - | 02 |
| දොම්පේ | 12 | 19 | 991 | 30 | | 03 |
| ජා ඇල | - | - | - | 05 | - | - |
| දිවුලපිටිය | 02 | 02 | 6456 | 14 | | 02 |
| මීනුවන්ගොඩ | - | 01 | - | 02 | - | - |
| කටාන | - | - | - | 03 | | |
| මීරිගම | - | | 600 | - | - | - |
| කැලණිය | - | 01 | - | 02 | | |
| බියගම | 06 | 20 | 1500 | 15 | 04 | 07 |
| වත්තල | | | 2175 | 10 | 03 | 08 |
| එකතුව | 22 | 64 | 11747 | 95 | 08 | 22 |

## ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය මගින් සපයනු ලබන ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරනුලබන වැඩසටහන්

### ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් වැඩිහිටි සංවිධාන පිහිටුවීම

වයස අවු 60ට වැඩි පුද්ගලයන් සාමාජිකත්වය ලබන මෙම සංවිධාන මගින් වැඩිහිටියන්ගේ සමාජ, ආර්ථික, ආගමික සහජීවනය ඇතිකරන අතර ඔවුන්ගේ සුභසාධනය සඳහා වන ස්ව උපකාරක කණ්ඩායම් ලෙස ක්‍රියාත්මක වේ. ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් පිහිටුවන ග්‍රාමීය වැඩිහිටි සංවිධාන වල නියෝජනයෙන් ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල පිහිටුවා ඇති අතර එම බලමණ්ඩල නියෝජිතයන්ගෙන් සමන්විතව දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩලය පිහිටුවා ඇත.

| ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය | දොම්පෙ | බියගම | කැලණිය | මහර | වත්තල | ජා ඇල | මීගමුව | දිවුලපිටිය | මීනුවන්ගොඩ | මීරිගම | කටාන | අත්තනගල්ල | ගම්පහ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිහිටුවාඇති සංවිධාන සංඛ්‍යාව | **115** | **39** | **37** | **75** | **37** | **57** | **30** | **114** | **90** | **117** | **40** | **150** | **70** | **971** |

**වයස අවු. 70 ඉක්මවූ වැඩිහිටි පුද්ගලයන් සඳහා රු.2000.00 ක වැඩිහිටි දීමනාව ලබාදීම**

| ප්‍රා.ලේ.කොට්ඨාශය | පුද්ගල සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය(වියදම) |
|---|---|---|
| දොම්පෙ | 2200 | 474886000.00 |
| බියගම | 1500 | 35140000.00 |
| කැලණිය | 968 | 21382000.00 |
| මහර | 1982 | 44876000.00 |
| වත්තල | 1080 | 25942000.00 |
| ජා ඇල | 1403 | 30224000.00 |
| මීගමුව | 2030 | 43795000.00 |
| දිවුලපිටිය | 2220 | 52086000.00 |
| මිනුවන්ගොඩ | 3131 | 72150000.00 |
| මීරිගම | 4905 | 66076000.00 |
| කටාන | 2969 | 61869000.00 |
| ගම්පහ | 2505 | 55934000.00 |
| අත්තනගල්ල | 3337 | 76416000.00 |
| **එකතුව** | **30230** | **1060776000** |

**ග්‍රාමීය වැඩිහිටි සංවිධාන සඳහා රු.5000.00 ආධාර ලබාදීම.**

| ප්‍රා.ලේ.කොට්ඨාශය | වැ.සංවිධාන සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය(වියදම) |
|---|---|---|
| දොම්පෙ | 20 | 100000.00 |
| බියගම | - | - |
| කැලණිය | - | - |
| මහර | 13 | 65000.00 |
| වත්තල | - | |
| ජා ඇල | - | - |
| මීගමුව | 09 | 45000.00 |
| දිවුලපිටිය | 05 | 25000.00 |
| මිනුවන්ගොඩ | 08 | 40000.00 |
| මීරිගම | 05 | 25000.00 |
| කටාන | 03 | 15000.00 |
| අත්තන ගල්ල | 12 | 60000.00 |
| **එකතුව** | **75** | **375000.00** |

<u>උපදේශන අංශය</u>

## දිස්ත්‍රික් මට්ටමින් සහ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක මනෝවිද්‍යාත්මක උපදේශන වැඩසටහන්වල සමස්ත ප්‍රගතිය - 2015

| අනු අංකය | උපදේශන වැඩසටහන | වැඩසටහන් ගණන | ප්‍රතිලාභීන් ගණන | | | ස්ථානය | ප්‍රතිපාදන(රු) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | මුළු ගණන | පිරිමි | ගැහැණු | | අමාත්‍යාංශ | වෙනත් |
| **01** | **දිස්ත්‍රික් වැඩසටහන්**<br>1. කාන්තාවන් සහ ළමුන් සඳහා මනෝ සමාජීය ප්‍රජා මූලික වැඩසටහන<br>2.මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීමේ වැඩසටහන<br>3.මනෝවිද්‍යාත්මක උපදේශනය සහ ආතති කළමණාකරණය දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිළධාරින් සහ දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර නිළධාරින් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන<br>4.සිය දිවි හානි කර ගැනීම අවම කිරීම සඳහා දිස්ත්‍රික්කයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ජාලගත කිරීමේ එක් දින වැඩමුළුව | 02<br>01<br>01<br>01 | 174<br>23<br>205<br>82 | 74<br>11<br>90<br>42 | 100<br>12<br>115<br>40 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>සමාරා උත්සව ශාලාව | 13850.00<br>12000.00 | ✓<br>1,20,000.00 |
| **02** | **ජාතික වැඩසටහන**<br>සේවාලාභීන්ගේ ඇගයීම් පත්‍රිකා පිළිබඳ .පුහුණු කිරීමේ වැඩසටහන | 03 | 31 | 07 | 24 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (කොළඹ, ගම්පහ, කෑගල්ල) | - | - |
| **03** | **අධ්‍යාපන උපදේශන වැඩසටහන්** | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **1.ශිෂ්‍ය** - මානසික සෞඛ්‍ය සංවර්ධනය , පෞරුෂ සංවර්ධනය | 03 | 380 | 180 | 200 | සිද්ධාර්ථ විද්‍යාලය, මීගමුව කොච්චිකඩේ විද්‍යාලය, | - | - |
| | 2. **දෙමාපිය** - මනෝවිද්‍යාත්මක උපදේශනය සහ ආතති කළමණාකරණය, මානසික සෞඛ්‍ය සංවර්ධනය, ළමා සංවර්ධනය, දෙමාපිය භූමිකාව හදුනා ගැනීම. | 04 | 556 | 239 | 317 | අත්තනගල්ල,ගම්පහ, දොම්පෙ, ජාඇල_ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | | |
| | 3. **ගුරුවරු** - ළමා මානසික සෞඛ්‍ය සංවර්ධනය, මානසික රෝග පිළිබඳ දැනුවත් කිරිම | 01 | 40 | 20 | 25 | ගම්පහ සිද්ධාර්ථ විද්‍යාලය | - | - |
| **04** | රාජ්‍ය නිළධාරීන් දැනුවත් කිරිම මනෝවිද්‍යාත්මක උපදේශනය සහ ආතති කළමණාකරණය, මානසික සෞඛ්‍ය සංවර්ධනය, ළමා සංවර්ධනය, ආකල්ප සංවර්ධනය, පෞරුෂ සංවර්ධනය. | 08 | 930 | 372 | 558 | කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අත්තනගල්ල, දොම්පෙ , ජාඇල, මීරිගම, මීගමුව ප්‍රාදේශීය ලේකම් මිනුවන්ගොඩ | - | - |
| **05** | ජ්‍යෙෂ්ඨ පුරවැසියන් දැනුවත් කිරිම, මානසික සෞඛ්‍ය සංවර්ධනය, මනෝවිද්‍යාත්මක උපදේශනය සහ ආතති කළමණාකරණය, නිරෝගී බව | 01 | 79 | 33 | 46 | ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | - | - |
| 06 | ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් මානසික සෞඛ්‍ය සංවර්ධනය, මනෝවිද්‍යාත්මක උපදේශනය සහ ආතති | 01 | 150 | 70 | 80 | මිරිගම | - | - |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | කළමණාකරණය, නිරෝගී බව, මානසික රෝග පිළිබඳ දැනුවත් කිරීම | | | | | | | |
| 07 | ප්‍රජා විශෝධන වැඩසටහන් මානසික සෞඛ්‍ය සංවර්ධනය, මනෝවිද්‍යාත්මක උපදේශනය සහ පෞරුෂ සංවර්ධනය | 02 | 60 | 60 | - | මීගමුව | - | - |
| 08 | බැනර් ප්‍රදර්ශනය කිරීම | 01 | 01 | - | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2000.00 | |
| | **මුළු එකතුව** | **28** | **2710** | **1198** | **1512** | **-** | **27850.00** | **120000.00** |

## <u>තනිපුද්ගල උපදේශනය - 2015</u>

| අනු අංකය | ගැටළුවේ ස්වභාවය | **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය** | **ගම්පහ රෝහල** |
|---|---|---|---|
| 01 | පවුල් | 07 | 23 |
| 02 | මානසික | 04 | 17 |
| 03 | අධ්‍යාපන | 03 | 09 |
| 04 | වෘත්තීය | 03 | - |
| 05 | **යොමුකිරීම්**<br>I. මනෝවෛද්‍ය<br>II. වෛද්‍ය<br>III. පුනරුත්ථාපන ආයතන | 03<br>02<br>-<br>01 | 14<br>10<br>04<br>- |
| 06 | උපදේශනයට පැමිණි මුළු සංඛ්‍යාව | 20 | 63 |
| 07 | යහපත් ජීවන තත්වයට ළගා වූ | 13 | 41 |
| 08 | උපදේශනය අවසන් කිරීමට නියමිත සංඛ්‍යාව | 10 | |
| | මුළු ගණන | 83 | |

## 01.15 වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්

**දැක්ම** - ලෝක මට්ටමේ ශ්‍රී ලාංකීය ශ්‍රම බලකායක්.

**මෙහෙවර** - ගෝලීය වශයෙන් තරගකාරි ශ්‍රම බලකායක් ගොඩ නැගීම හා මානව සම්පත්වල මුලු ශක්තිය සමාජ ආර්ථික සංවර්ධනය සදහා යොදා ගැනීම.

**අංශයේ අරමුණු**

1. රැකියා නිර්මාණය හා ප්‍රවර්ධන
2. වෘත්තීය මාර්ගෝපදේශනය.
3. ඒ යටතේ ජාතික මානව සම්පත් සංවර්ධනය හා රැකී රක්ෂා ප්‍රතිපත්තිය අනුව දෙපාර්තමේන්තුවේ මෙම වැඩසටහන්

- වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය.
- වෘත්තීය මාර්ගෝපදේශනය.
- අවිධිමත් රැකියා නියුක්තිය.

යන ප්‍රධාන අරමුණු ලභාකර ගැනීමට බලාපොරොත්තු වේ.

**රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන වැඩසටහන්වල සමස්ත ප්‍රගතිය - 2015**

| | වාර්ෂික ඉලක්ක | | | සපුරාගත් මට්ටම | | |
|---|---|---|---|---|---|---|
| රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන අංශයේ වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභින් සංඛ්‍යාව | වෙන් වූ මුදල් ප්‍රමාණය(රු) | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභින් සංඛ්‍යාව | වැය වූ මුදල් ප්‍රමාණය (රු) |
| රැකියා සමාජ වැඩසටහන | 02 | 60 | 65,900.00 | 02 | 66 | 65,900.00 |
| ව්‍යාවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන | 01 | 30 | 25,870.00 | 02 | 66 | 25,870.00 |
| අවශ්‍යතා මත පුහුණු වැඩසටහන | 10 | 300 | 80,910.00 | 22 | 572 | 80,910.00 |
| සංචාරක ක්ෂේත්‍රයේ රැකියාගත කිරීමේ වැඩසටහන | 01 | 40 | 26,850.00 | 01 | 35 | 26,815.00 |
| අවදානමට ලක් වූ කණ්ඩායම් රැකියා ගත කිරිම | 04 | 120 | 37,370.00 | 05 | 140 | 37,370.00 |
| රැකියා 100 වැඩසටහන | 01 | 300 | 100,000.00 | 01 | 210 | 99,000.00 |
| උද්‍යාන කළමනාකරණ වැඩසටහන | 01 | 30 | 33,260.00 | 01 | 34 | 33,260.00 |
| ප්‍රාදේශිය රැකියා පොළ වැඩසටහන් | - | - | - | 01 | 250 | |
| ඍජු රැකියා ගත කිරිම් | - | - | - | - | 432 | - |
| එකතුව | **20** | **880** | **370,160.00** | **35** | **1805** | **369,125.00** |

## වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්වල වාර්ෂික ප්‍රගතිය

| | වාර්ෂික ඉලක්ක | | | සපුරාගත් මට්ටම | | |
|---|---|---|---|---|---|---|
| වෘත්තිය මාර්ගෝපදේශන අංශයේ වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙන් වූ මුදල් ප්‍රමාණය (රු) | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වැය වූ මුදල් ප්‍රමාණය (රු) |
| සාමන්‍ය පෙළ වැඩසටහන් | 115 | 4025 | - | 128 | 3952 | - |
| උසස් පෙළ  වැඩසටහන් | 103 | 3090 | - | 121 | 3650 | - |
| ගුරුවරු දැනුවත් කිරිමේ වැඩසටහන | 08 | 320 | 264,660.00 | 12 | 563 | 242,850.00 |
| ස්වයං රැකියා පෙළඹවිමේ වැඩසටහන | 02 | 60 | 4,780.00 | 06 | 163 | 4,780.00 |
| වෘත්තිය අභියෝග ජය ගැනිමේ වැඩසටහන | 03 | 90 | 22,690.00 | 09 | 343 | 22,690.00 |
| දෙමාපියන් දැනුවත් කිරිමේ වැඩසටහන | 13 | 1300 | 50,000.00 | 17 | 1472 | 50,000.00 |
| අපොසින් පසු වැඩසටහන | 01 | - | 50,000.00 | 03 | 523 | 32,900.00 |
| බාහිර උපාධි වැඩසටහන | 02 | 80 | 55,500.00 | 02 | 80 | 55,300.00 |
| අභ්‍යන්තර උපාධි වැඩසටහන | 02 | 80 | 55,500.00 | 02 | 127 | 55,500.00 |
| වෘත්තිය මංපෙත් වැඩසටහන | - | - | - | 04 | 523 | - |
| වෘත්තිය මාර්ගෝපදේශන සේවාව ලබා දිම | - | 1960 | - | - | 1901 | - |
| වෘත්තිය කාර්යාය සාධනය(පුහුණුවට යොමු කිරිම් ) | - | 1700 | - | - | 1949 | - |
| අවදානමට ලක් වුවන් සඳහා මාර්ගෝපදේශන | 112 | 1120 | - | 93 | 1923 | - |
| **එකතුව** | **361** | **13825** | **503,130.00** | **397** | **17169** | **464,020.00** |

## ජාතික රැකියා මධ්‍යස්ථානයේ ප්‍රගතිය

| මාසය | රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කළ සංඛ්‍යාව | රැකියා ඇබෑර්තු ලියාපදිංචි කළ සංඛ්‍යාව | රැකියා ගැලපීම් කළ සංඛ්‍යාව | රැකියා ගත කළ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජනවාරි | 91 | 65 | 104 | 29 |
| පෙබරවාරි | 105 | 98 | 113 | 19 |
| මාර්තු | 158 | 106 | 182 | 21 |
| අප්‍රේල් | 61 | 45 | 53 | 15 |
| මැයි | 98 | 83 | 23 | 23 |
| ජූනි | 78 | 105 | 21 | 21 |
| ජූලි | 145 | 150 | 153 | 41 |
| අගෝස්තු | 154 | 115 | 78 | 15 |
| සැප්තැම්බර් | 145 | 355 | 81 | 11 |
| ඔක්තොම්බර් | 144 | 38 | 102 | 14 |
| නොවැම්බර් | 63 | 103 | 55 | 8 |
| දෙසැම්බර් | 123 | 48 | 65 | 4 |
| **එකතුව** | **1365** | **1311** | **1030** | **221** |

## 01.16ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ගම්පහ දිස්ත්‍රික්කයට අනුයුක්ත කර ඇති ඵලදායිතා ප්‍රවර්ධන නිලධාරීන් විසින් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයට අදාලව දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් අංශ වශයෙන් පහතින් දැක් වේ.

1. පාසල් අංශ සඳහා ඵලදායිතා පුහුණු සහ ප්‍රවර්ධන වැඩසටහන
2. රාජ්‍ය අංශය සඳහා ඵලදායිතා පුහුණු සහ ප්‍රවර්ධන වැඩසටහන
3. පෞද්ගලික අංශය සඳහා ඵලදායිතා පුහුණු සහ ප්‍රවර්ධන වැඩසටහන
4. ප්‍රජා ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන
5. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘති

**දිස්ත්‍රික් වැඩසටහන් 2015**

| අංශය | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| පෙර පාසැල් | 72 |
| පාසැල් | 140 |
| රාජ්‍ය අංශය | 135 |
| පුද්ගලික අංශය | 20 |
| ගම්මාන | 34 |
| <u>**විශේෂ ව්‍යාපෘති**</u> | |
| 01 කයිසෙන් ව්‍යාපෘතිය | ආයතන 40 |
| 03 ජාතික ඵලදායිතා සම්මාන 2015 - ඉදිරිපත් වූ ආයතන | |
| • රාජ්‍ය අංශය | ආයතන 39 |
| • පාසැල් අංශය | ආයතන 60 |
| • පෞද්ගලික අංශය | ආයතන 19 |
| 04 දිස්ත්‍රික් ඵලදායිතා වැඩමුළු | ආයතන 110 |

**1. කයිසෙන් ව්‍යවසායක වැඩසටහන**

ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද නියමු ව්‍යාපෘතියක් වන කයිසෙන් ව්‍යවසායකයෝ වැඩසටහන මගින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ඵලදායිතා සංකල්ප භාවිතයෙන් වැඩි දියුණු කරන අතර, මෙම වැඩසටහන ආයතන 60 ක ක්‍රියාත්මක වේ. එමගින්,

- ආයතන තුළ ඵලදායිතා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ඵලදායිතා සම්මානලාභී ආයතන නැරඹීමට යාම
- දිස්ත්‍රික්කය තුළ ආයතන මට්ටමින් දැනුම හුවමාරු කර ගැනීම
- ජාත්‍යන්තර මට්ටමේ පුහුණු අවස්ථා ලබාදීම
- වාර්ෂික සුහද හමුව සහ ක්‍රිකට් තරගාවලිය
- ජාතික ඵලදායිතා සම්මානයට ඉදිරිපත් කිරීම
- නව රැකියා බිහි කිරීම
- ව්‍යාපාරික අවස්ථා පුළුල් කිරීමට අදාල ආයෝජන සඳහා පෙළඹවීම

2. ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව සහ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් ආරම්භ කරන ලද පොලිස් ස්ථාන තුළ ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනට සමගාමීව ගම්පහ දිස්ත්‍රික්කයේ සියලුම පොලිස් ස්ථාන වල මෙම වැඩසටහන ආරම්භ කර ක්‍රියාත්මක වේ.

3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරාගනු ලැබූ පෙර පාසැල් සඳහා ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන, මෙම වැඩසටහන සඳහා පෙර පාසැල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරාගනු ලැබූ පෙර පාසැල් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් 5 බැගින් 65ක් තෝරා ගෙන ඇති අතර ඒවා ඵලදායීතා සංකල්ප භාවිතයෙන් ප්‍රවර්ධනය කිරීම.

4. අන්තර් පාසැල් ඵලදායිතා ප්‍රවර්ධන කථික තරගාවලිය
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පාසැල් අතර තරග පවත්වා ජයග්‍රාහකයින් දිස්ත්‍රික් තරගාවලියට සහභාගි කරවීම

05. 2015 ජාතික ඵලදායිතා තරඟාවලියේ ජාතික මට්ටමේ පළමු , දෙවන හා තුන්වන ස්ථාන ලැබූ ආයතන

- පාසැල් අංශය - බප./ ගම්. / රත්නාවලී බාලිකා විද්‍යාලය ( S1 ) - ප්‍රථම ස්ථානය
- පාසැල් අංශය - බප./ ගම්. / බණ්ඩාරනායක විද්‍යාලය ( S1 ) - දෙවන ස්ථානය
- පාසැල් අංශය - බප./ ගම්. / මණ්ඩාවල ප්‍රථමික විද්‍යාලය ( S3 ) - දෙවන ස්ථානය

- රාජ්‍ය අංශය - කලාප අධ්‍යාපන කාර්යාලය , ගම්පහ - දෙවන ස්ථානය
- රාජ්‍ය අංශය - දිස්ත්‍රික් මූලික රෝහල , වතුපිටිවල - දෙවන ස්ථානය
- රාජ්‍ය අංශය - ප්‍රාදේශිය සභාව , දොම්පේ - දෙවන ස්ථානය
- රාජ්‍ය අංශය - පොලිස් ස්ථානය , සපුගස්කන්ද - තෙවන ස්ථානය

- නිෂ්පාදන හා සේවා අංශය - ව්‍යාපෘති හා අධිසැර නඩත්තු බටහිර කලාප කාර්යාලය ලංකා විදුලි බල මණ්ඩලය, ගම්පහ - දෙවන ස්ථානය
- නිෂ්පාදන හා සේවා අංශය - ශ්‍රී ලංකා ටෙලිකොම් , ප්‍රාදේශිය කාර්යාලය, ගම්පහ - තෙවන ස්ථානය
- නිෂ්පාදන හා සේවා අංශය - ෆොන්ටෙරා බ්‍රැන්ඩ් ලංකා ( පුද්ගලික ) සමාගම - තෙවන ස්ථානය

## 01.17 ක්‍රීඩා කටයුතු

### දැක්ම

“ නිරෝගිමත්, ක්‍රියාශීලී, සමාජයක් තුලින් සමෘද්ධිමත් දේශයක් සඳහා ක්‍රීඩාව“

### මෙහෙවර

“ක්‍රීඩාව සංවර්ධනය තුළින් ශ්‍රී ලාංකිකයන් ක්‍රියාශීලී, නිරෝගී, විනය ගරුක, අභිමානවත් ජාතියක් ලෙස ලොව දස්කම් දැක්වීමට පසුබිම සකස් කිරීම“

### අරමුණු

- ක්‍රීඩාව තුළින් නිරෝගිමත් පුරවැසියන් පිරිසක් රටට දායාද කර දී රටේ සංවර්ධනයට උරදීම.
- ජාති, ආගම්, වර්ණ, කුල, පක්ෂ භේදයකින් තොරව ජාතික සමගිය ඇතිකිරීම සඳහා දායක වීම.
- ක්‍රීඩාව තුළින් ශ්‍රී ලාංකීය නාමය ජාත්‍යන්තරයට ගෙනයාම.
- ක්‍රීඩා කුසලතා ඇති තරුණ තරුණියන් හඳුනාගෙන ඔවුන් පෝෂණය කිරීම හා අවශ්‍ය පහසුකම් සපයා දීම තුළින් කුසලතා වැඩි දියුණු කිරීම.
- ක්‍රීඩාවේ උන්නතිය සඳහා අවශ්‍ය වන භෞතික, මානව හා අනෙකුත් සම්පත් සංවර්ධනය කිරීම.
- තරඟකාරී අධ්‍යාපන ක්‍රමයත් සමඟ ක්‍රීඩා කුසලතා දක්වන දරු දැරියන් සඳහා අධ්‍යාපනයට සමගාමීව ක්‍රීඩාව සංවර්ධනය කිරීම හා අධ්‍යාපනය අවසන් කළ පසු ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ඔවුන් රඳවා ගැනීම සඳහා මානසික හා ශරීර සෞඛ්‍ය උද්දීපනය කිරීම.
- ජාතික ක්‍රීඩා සංගම්වල පරිපාලනය හා සංවර්ධනය විධිමත් කිරීම.

කාර්යභාරය

1. මානව සම්පත් සංවර්ධනය

- ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා විධිමත් පුහුණුවක් ලබාදීම.
- ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර තලයේ ක්‍රීඩා තරඟ වලට යොමු කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- ක්‍රීඩා පුහුණුකරුවන්ට හා ක්‍රීඩා නිලධාරීන්ට විදේශ පුහුණුව ලබාදීම.
- විදේශ පුහුණුකරුවන් යොදාගෙන ශ්‍රී ලාංකික පුහුණුකරුවන් පුහුණු කිරීම.
- ක්‍රීඩා නිලධාරීන්ට නව තාක්ෂණය ලබා දීම සඳහා තාක්ෂණ පුහුණු වැඩමුළු සංවිධානය කිරීම.
- දේශීය හා විදේශීය ක්‍රීඩා විශේෂඥයන් ලවා ක්‍රීඩා සම්මන්ත්‍රණ පැවැත්වීම.
- දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන් ක්‍රීඩා අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීම.

යටිතල පහසුකම් සංවර්ධනය

- ජාත්‍යන්තර තරඟ සඳහා යෝග්‍යවන ක්‍රීඩා සංකීර්ණ ඇති කිරීම.
- ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩාංගන සංවර්ධනය කිරීම හා නවීකරණය කිරීම.
- ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය.
- ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ සැපයීම.

## 1. ජාතික මහා ක්‍රීඩා උළෙල පැවැත්වීම

ජාතික මහා ක්‍රීඩා උළෙල 1969 දී ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් තරඟ පැවැත්වීම තුළින් ආරම්භ වී 1972 වසරේ දී මනා සංවිධානයකින් යුතුව කොළඹ සුගතදාස ක්‍රීඩාංගනයේ පවත්වන ලදී. මෙම ජාතික මහා ක්‍රීඩා උළෙලේ ප්‍රධාන අරමුණ වන්නේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමේ හා දිස්ත්‍රික් මට්ටමේ තරඟ පවත්වා අවසානයේ පළාත් තරඟ දක්වා දක්ෂතා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් ජාතික මට්ටමේ දක්ෂතා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගෙන විධිමත් පුහුණුවක් ලබා දී ඔවුන්ව ජාත්‍යන්තර තලයට යොමු කිරීමයි.

## <u>2015 වර්ෂයේ ක්‍රීඩා ශක්ති දිස්ත්‍රික් සංචිත වැඩසටහන</u>

2015 වර්ෂයේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රීඩා ශක්ති දිස්ත්‍රික් සංචිත සඳහා සහභාගී වූ ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මාසික දීමනාවක් ලබාදීම සිදුවිය. ඒ අනුව හොකී, බාස්කට් බෝල්, මලල ක්‍රීඩා (කාන්තා/ පිරිමි), පාපන්දු (කාන්තා/ පිරිමි), වොලිබෝල් (කාන්තා/ පිරිමි), රෙස්ලින්, නෙට්බෝල් යන ක්‍රීඩා සංචිත සඳහා මාසික මුදල් දීමනා ගෙවීමට ලබාදෙන ලදී.

- දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගැනීම සඳහා මාසික පුහුණු කඳවුරු පැවැත්වීම.
- ජාතික මහා ක්‍රීඩා උළෙලේ මලල ක්‍රීඩා හා සමස්ථ ශූරතාවය ගම්පහ දිස්ත්‍රික්කය ඇතුළු බස්නාහිර පළාත දිනාගන්නා ලදී.
- දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 13ක එක් එක් කොට්ඨාශ තුල තරඟ පැවැත්වීම.
- ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා උළෙල පැවැත්වීම.
- සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකම පුහුණු මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.
- ගම්පහ ශ්‍රී බෝධි ක්‍රීඩාංගනය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට පහසුකම් ලබා දී පවත්වාගෙන යාම.
- සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකටම මධ්‍යම රජය රුපියල් ලක්ෂ 05 බැගින් ලබා දී එක් ක්‍රීඩා පිටිය බැගින් නවීකරණය කිරීම.
- ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් විශාල ප්‍රමාණයක් ජාතික හා ජාත්‍යන්තරතරඟ වලට සහභාගී වී ජයග්‍රහණය කිරීම.
- දෙවන පෙළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සොයා ගැනීම වෙනුවෙන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ ක්‍රීඩා උළෙල සඳහා 16න් පහළ ක්‍රීඩා තරඟාවලියක් හඳුන්වා දීම.

## 01.18 ළමා හිමිකම් ප්‍රවර්ධන අංශය

| අනු අංකය | වැඩ සටහන | පැවැත්වූ වැඩ සටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වැයවූ ප්‍රතිපාදන .රු | ප්‍රතිපාදනලබාදුන් ආයතනය |
|---|---|---|---|---|---|
| 01 | ළමා අපයෝජන පිටුදැකීම හා ළමා අයිතීන් සුරැකීම පිළිබඳව දෙමාපියන්දැනුවත් කිරීම් | දෙමාපියන්දැනුවත් කිරීම් වැඩසටහන් 06 | දෙමාපියන් 1200 | 150,000.00 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේ/ එන්.ඩී.බී.බැංකුව |
| 02 | ළමා අපයෝජන පිටුදැකීම හා ළමා අයිතීන් සුරැකීම පිළිබඳව ළමයින් දැනුවත් කිරීම් | ළමයින් දැනුවත් කිරීම් වැඩ සටහන් 05 | ළමයින් 600 | 30,000.00 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව. |
| 03 | වීදි දරු සුභ සාධන ව්‍යාපෘතිය | සුන්දර ළමාවියක් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් 05ක් පැවැත්වීම/ දරුවන් සඳහා අධ්‍යාපන හා විනෝද චාරිකාවක් යාම හා ආකල්ප සංවර්ධන වැඩ සටහනක් පැවැත්වීම/ දරුවන් සඳහා අධ්‍යාපන උපකරණ ලබාදීම/ වීදි දරු දැරියන්ගේ කුසලතා ඇගයීම හා සංස්කෘතික උත්සවයක් පැවැත්වීම/ වීදි දරු දැරියන් සඳහා ක්‍රීඩා උපකරණ ලබාදීම./ වීදි දරු දැරියන් සඳහා පුස්තකාල පොත් ලබාදීම/ වීදි දරු දැරියන් සඳහා ආරක්ෂණ සැලසුම් සකස් කිරීම | වීදි දරුවන් හා දෙමාපියන් 100 ක් | 2 65,000.00 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව /කලාප අධ්‍යාපන කාර්යාලය - මීගමුව |
| 04 | ළමා සංවර්ධන මධ්‍යස්ථාන දරු දැරියන්ගේ ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය | ළමා සංවර්ධන මධ්‍යස්ථාන දරු දැරියන්ගේ ධාරිතා සංවර්ධන වැඩ සටහන් 08ක් පැවැත්වීම. | දරු දැරියන්ගේ 450 ක් | 117,000 00 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව |
| 05 | දිස්ත්‍රික් ළමා සභාව ක්‍රියාත්මක කිරීම | දිස්ත්‍රික් ළමා සභාව වාර 04ක් පැවැත්වීම හා දැනුවත් කිරීම් වැඩ සටහන් 02ක් පැවැත්වීම. | දිස්ත්‍රික් ළමා සභාවේ සාමාජිකයින් 65ක් | 60,000.00 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (පලාත් හා මධ්‍යම රජය) |

| | | | | | |
|---|---|---|---|---|---|
| 06 | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගේ ප්‍රගති සමා ලෝචන පැවැත්වීම හා ධාරිතා සංවර්ධන වැඩ සටහනක් පැවැත්වීම. | ප්‍රගති සමාලෝචන පැවැත්වීම 10ක් හා ධාරිතා සංවර්ධන වැඩ සටහන01ක් පැවැත්වීම. | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් 21ක්. | 85,000.00 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව / එෆ්.අයි.එස්.ඩී.ආයතනය |
| 07 | දකුණු ආසියාතික රටවල දරුවන්ගේ ආරක්ෂණ වැඩ සටහන | රාජ්‍ය නොවන හා ස්වෙච්ඡා ආයතන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් කමිටුවක් පැවැත්වීම හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම. | රාජ්‍ය හා ස්වේච්ඡා ආයතන නිලධාරීන්100ක්. | 25,000.00 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව |
| 08 | ආධාර ලබන ළමුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම | දරුවන් හා දෙමාපියන් 300ක් සඳහා වැඩ සටහන පැවැත්වීම-දරුවන්ට පාසැල් බෑග් ලබාදීම. | දරුවන් හා දෙමාපියන් 300ක් | 95,000.00 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව |
| 09 | ග්‍රාමීය ළමාරක්ෂක කමිටු ශක්තිමත් කිරීම | ග්‍රාමීය ළමාරක්ෂක කමිටු නිලධාරීන් 150ක් ළමාරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීම | ග්‍රාමීය ළමාරක්ෂක කමිටුනිලධාරීන් 150ක් | 83,000.00 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව |
| | **එකතුව** | | | **910,000.00** | |

දිස්ත්‍රික් ළමා හිමිකම් ප්‍රවර්ධන වැඩ සටහන් යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන් - 2015 වර්ෂය

## 01.19 මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන

| අනු අංකය | වැඩසටහන | භෞතික ප්‍රගතිය | මුදල රු. | ප්‍රතිලාභීන් | වෙනත් (ක්‍රියාත්මක වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන) |
|---|---|---|---|---|---|
| 1 | සෙනෙහෙ තටාක | මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ප්‍රතිලාභීන්ගේ දැනුම ඉහළයාම. | 65,200.00 | 560 | 11 |
| 2 | පෝෂණ මංපෙත | ගෙවතුවගා කටයුතු සඳහා පෙරපාසල් ගුරුවරියන්, දෙමාපියන් , දරුවන් යොමුවීම. දැනුම වර්ධනය කිරීම. | 79,212.0 | 472 | 8 |
| 3 | නැණ දීපනී | ගුරුවරුන්ගේ දැනුම යාවත් කාලීන වීම. | 99,270.00 | 435 | 10 |
| 4 | ප්‍රාදේශීය කමිටු | කමිටු 10ක් ක්‍රියාත්මක විය. කොට්ඨාශයේ ගැටළු සාකච්ජා කිරීම. | 7,905.00 | 519 | 06 |
| 5 | ප්‍රගති සමාලෝචන රැස්වීම් | වැඩසටහන් පිළිබඳ සාකච්ජාව / ක්ෂේත්‍ර ගැටළු, ඉදිරි වැඩ සාකච්ජාව, සුහදතාවය වර්ධනය. | 7,265.00 | 40 | රැස්වීම් 07 |
| 6 | ජාතික මුල් ළමාවිය රැකවරණ සතිය | මුල් ළමාවිය දරුවන් සෞන්දර්යාත්මක අත්දැකීම් විඳගැනීම, චාරිකා යාම, ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන වීම. | 148,683.20 | 591 | 10 |
| 7 | සෙල්ලම් මිදුල වැඩසටහන | පිරමීඩය, ආසන 02 ඔන්චිල්ලාව | 50,000 | 50 | 01 |
| 8 | අධ්‍යාපන උපකරණ කට්ටල | අධ්‍යාපන උපකරණ දරුවන් විසින් භාවිතය තුළින් කුසලතා සංවර්ධනය කර ගැනීම. | කට්ටල 21 | 892 | 08 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 9 | ගැහැණු දරුවාගේ ජාත්‍යන්තර දිනය | පාසල් දරුවන් ළමා අපයෝජනය පිළිබඳ දැනුවත්වීම | 20,000.00 | 176 | 01 |
| 10 | දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුව | දිස්ත්‍රික්කය තුළ ළමා ක්ෂේත්‍රෙය් ගැටළු සාකච්ජාව | 28,500.00 | 186 | කමිටු 02 |
| 11 | ලෝක ළමා දින වැඩ. | ළමයින් විනෝදාස්වාදයක් ලැබීම, දැනුම ලැබීම | 124,938.80 | 1220 | 10 |
| 12 | සෞන්දර්ය- අරුණ දකින රටා | චිත්‍ර ඇඳීමේ කුසලතා සංවර්ධනය, තරග ජයග්‍රහණ, ත්‍යාග ලැබීම ආදය තුළින් ආත්මාභිමානය වර්ධනය කරගැනීම | 149,913.00 | 3995 | 10 |
| 13 | කිරිවීදුරුව වැඩසටහන | දරුවන්ගේ සෞඛ්‍ය සම්පන්න බව වර්ධනය | 2,336,801.00 | 1372 | 10 |
| 14 | ගර්භණී මව්වරුන් සඳහා පෝෂණ මල්ල වැඩසටහන | මව්වරුන්ගේ පෝෂණ මට්ටම ඉහළයාම තුළින් දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළයාමට බලපෑම. | 183,680,664.90 | 91981 (මලු ගණන) | 13 |
| 15 | ළමා දිරිය වැඩසටහන | ගුරුවරුන් සඳහා රු.250/-ක දීමනාවක් ලැබීම | 1368500.00 | 783 | 12 |

## 01.20 දිස්ත්‍රික් ළමාරක්ෂක අධිකාරිය

### ක්‍රියාකාරකම - පාසල් ළමාරක්ෂක කමිටු පිහිටුවීම

මේ වන විට දිස්ත්‍රික්කය තුළ පාසල් ළමාරක්ෂක කමිටු 160ක් පමණ පිහිටුවා ඇත. එයින් පාසල් 60 සඳහා සුරක්ෂිත පාසලක් ගොඩනැගීමේ අරමුණින් සිනහ කඳුළු පෙට්ටිය නමින් පැමිණිලි සහ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා 2015/09/20 දින පැමිණිලි පෙට්ටි 60 පාසල් 60 සඳහා ප්‍රදානය කරන ලදී· මෙම වැඩසටහන සඳහා ප්‍රතිපාදන වශයෙන් රු. 48,000.00 ක මුදලක් ලබාදුනි.

### දැනුවත් කිරීමේ වැඩසටහන්

1.) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සිසුන් දැනුවත් කිරීම - ළමාරක්ෂාව පිළිබඳ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන 2015/09/18 දින සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේදී ගුරු සිසුන් 300 ක් සඳහා පවත්වන ලදී. මේ සඳහා ප්‍රතිපාදන වශයෙන් රු. 46,000.00 ක මුදලක් ලැබුණි.

2) ග්‍රාමීය සිවිල් නායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන - මෙම වැඩසටහන, 2015/10/19 දින දිස්ත්‍රික් සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලීය ශ්‍රවණාගාරයේදි පවත්වන ලදි· මෙම වැඩසටහන සඳහා ප්‍රතිපාදන වශයෙන් රු.45,000.00 ක මුදලක් ලබාදුනි. මේ සඳහා සිවිල් නායකයින් 100ක පිරිසක් සහභාගි විය.

3) පාසල් වෑන්රථ රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහන - මෙම වැඩසටහන 2015/ 09/ 29 වන දින දිස්ත්‍රික් සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලීය ශ්‍රවණාගාරයේදි පැවැත්වූ අතර මේ සඳහා ගම්පහ තොට්ඨාශයේ පාසල් වෑන්රථ රියදුරන් 150 ක් පමණ සහභාගි විය.මෙම වැඩසටහන සඳහා රු. 20,000.00 ක ප්‍රතිපාදන ලබා දුනි.

4) දැනුවත් කිරීමේ වැඩසටහන - මේ යටතේ ළමා අපයෝජන හා ළමාරක්ෂාව සම්බන්ධයෙන් වැඩසටහන් 03ක් පැවැත්වූ අතර එම වැඩසටහන් ඉඳිගොල්ල විජිත ක. විදුහලේ සිසුන් හා දෙමව්පියන් 300 සඳහා ද, සිවිල් ප්‍රජාව 100 සඳහා හේන්පිටමුල්ල විහාරස්ථානයේදි ද, දහම් පාසල් සිසුන් 120ක් සඳහා මාඉඹුල ශ්‍රී සාරානන්ද දහම් පාසලේදී ද පවත්වන ලදී. මේ සඳහා ප්‍රතිපාදන වශයෙන් රු.10,000.00 ක මුදලක් ලැබුණි.

5) සුරඟන ළමා ගම්මාන වැඩසටහන - මෙම වැඩසටහන සඳහා කාන්තාවන් 150 ක් සඳහා ළමා අපයෝජනය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2015/09/14 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදි පැවැත්වූ අතර මේ සඳහා ප්‍රතිපාදන වශයෙන් රු.10,000.00 ක මුදලක් ලැබුණි.

6) ළමා නිවාස දැනුවත් කිරීමේ වැඩසටහන - මෙම වැඩසටහන දිස්ත්‍රික්කය පුරා පවතින ළමා නිවාස 20 ක දින 15 ක් තුළ සිදු කරන ලදි. මේ සඳහා වෛද්‍යවරුන්, පවුල් සෞඛ්‍ය සේවිකාවන්, මහජන සෞඛ්‍ය පරීක්ෂක සහ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිළධාරීන් සහභාගී විය. මෙම වැඩසටහන සඳහා රු. 97,000.00 ක මුදලක් ලබාදුනි.

## 01.21 සංස්කෘතික අංශය

**දැක්ම**

ප්‍රෞඪ ජාතික උරුමයක් හිමි ශ්‍රී ලාංකික ජාතිය ස්වකීය සංවර්ධනයේ ජීවය වූ සංස්කෘතික අනන්‍යතාවය සුරක්ෂිත කර ගනිමින් ද, නවීන ප්‍රවනතාවයන්ට ගැලපෙන ලෙසින්ද ,ලොව අන් රටවල් සමග සුහදශීලීව ද, සමහිව ද ප්‍රබල රටක් ලෙස ඉදිරියට යමින් නැගී සිටීමයි.

**මෙහෙවර**

ශ්‍රී ලාංකික ජාතික උරුමය ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම, ප්‍රවර්ධනය හා ප්‍රචාරණය කිරීමෙන් ලබන සංස්කෘතික අනන්‍යතාව සංවර්ධන ඉලක්ක සපුරාලන උත්ප්‍රේරක බලයක් ලෙසින් මෙහෙයවා, ශ්‍රී ලංකාව ප්‍රෞඪ ජාතියකින් හෙබි සංවර්ධිත රටක් ලෙස පවත්වාගෙන යාමට සහාය වීම.

## පෙරහැර සංවිධානය

- කැලණිය රජමහා විහාරස්ථ වාර්ෂික දුරුතු මහා පෙරහැර - උඩ මළුවේ පෙරහැර 2016.01.19 දින සිට 22 දින දක්වා උත්කර්ෂවත් අන්දමින් පැවැත් වූ අතර, මෙම පෙරහැර පැවැත්වීම සඳහා අවශ්‍ය සියළු පහසුකම් සැපයීමට රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන අතර සියළු සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.
- හැදල පුරාණ විහාරයේ බුද්ධ ජයන්ති පෙරහැර/ වාරණ රජ මහ විහාරයේ වාර්ෂික පෙරහැර/ බෝතලේ ශ්‍රී ගෝධාභය රජ මහ විහාරයේ බිනර මහ පෙරහැර/ පහළගම විද්‍යාරවින්ද්‍ර පිරිවෙනේ සංඝමිත්තා පෙරහැර / ගම්පහ සාම විහාරයේ වෛශාඛ්‍ය තෙමඟුල් මහා පෙරහැර - සංවිධානය හා සම්බන්ධීකරණය
- ඉදිගොල්ල, ශාන්ත ජුඩ් දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය 2015.10.24 හා 25 දිනවල පැවැත්වූ අතර, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

**<u>ජාතික කලායතන විභාගය</u>**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කලායතන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 200ක් සඳහා ගම්පහ තක්ෂිලා විදුහලේදි 2015.03.28 හා 29 දින ජාතිත කලායතන විභාගයේ ප්‍රායෝගික පරීක්ෂණ පවත්වන ලදී.

**<u>ජාතික නර්තන තරඟාවලිය - 2015</u>**

ජාතික නර්තන තරඟාවලියට සමගාමීව වාර්ෂිකව පවත්වන දිස්ත්‍රික් නර්තන තරඟාවලිය කලායතන ශිල්පීන් 3000 පමණ සහභාගීත්වයෙන් 2015.11.07 වන දින ගම්පහ තක්ෂිලා විද්‍යාලයේදි පවත්වන ලදී.

**<u>රාජ්‍ය ළමා චිත්‍ර උළෙල - 2015 ( දිස්ත්‍රික් තරඟාවලිය)</u>**

රාජ්‍ය ළමා චිත්‍ර උළෙලේ දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රාහකයන් තෝරා ගැනීම සඳහා පවත්වනු ලැබූ ගම්පහ දිස්ත්‍රික් ළමා චිත්‍ර තරඟාවලිය සිසුන් 750 පමණ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ චිත්‍ර මූර්ති අනුමණ්ඩලය වෙත යොමු කරන ලදී.

**<u>දිස්ත්‍රික් සාහිත්‍ය තරඟාවලිය හා දිස්ත්‍රික් සාහිත්‍ය කලා මහෝත්සවය</u>**

- ප්‍රාදේශීය මට්ටමින් ජයග්‍රහණය කළ සාහිත්‍ය නිර්මාණ දිස්ත්‍රික් තරඟ සඳහා ඉදිරිපත් කිරීම හා ඉන් ජයග්‍රහණය කළ නිර්මාණ ජාතික මට්ටමට ඉදිරිපත් කිරීම.

- දිස්ත්‍රික් තරඟාවලිය සිංහල,දෙමළ,හා ඉංග්‍රීසි යන අංශ තුනෙන්ම පවත්වන ලදී.තරඟ ඉසව් 35 සඳහා ස්ථාන 90 ක් තෝරා ගන්නා ලදී.

2015 - ජාතික සාහිත්‍ය කලා මහෝත්සවයට සමගාමීව ගම්පහ දිස්ත්‍රික් සාහිත්‍ය කලා මහෝත්සවය 2015.11.27 දින ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේදී සංගීත ශිල්පි රොඩ්නි වර්ණකුල මහතා හා නර්තන කණ්ඩය විසින් පවත්වන ලද ප්‍රාසාංගික වැඩසටහන ත්‍යාග ප්‍රදානෝත්සවය පාසල් සිසුන් හා දිස්තික්කයේ විශේෂ අමුත්තන් 600 ක පමණ සහභාගිත්වයෙන් උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදි.

**ගම්පහ දිස්ත්‍රික් ලේඛක සංගමය මගින් පවත්වන වාර්ෂික වැඩසටහන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති ගම්පහ දිස්ත්‍රික් ලේකක සංගමය හා එක්ව 2015 වර්ෂයේ විශේෂ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී.

- නව නිලධාරි මණ්ඩලය පත්කිරීම.
- ප්‍රවීන ලේඛක, කැලණිය විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යන අංශයේ මහාචාර්ය සුසන්ත මහඋල්පත මහතා විසින් නිර්මාණයක් විචාරය කරන්නේ කෙසේද - 11 (තාක්ෂනික මෙවලම් භාවිතය )යන්න පිළිබඳව දේශනයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී සංවිධානය කරන ලදී
- ගම්පහ දිස්ත්‍රික් ලේඛක සංගමයේ සාහිත්‍ය උළෙල පැවැත්වීම සඳහා මුද්‍රිත අංශයේ හොඳම නව කථාව, කෙටි කථාව, පද්‍ය සංග්‍රහය හා පරිවර්තන කෘතිය තේරීමත් අත් පිටපත් අංශයේ හොඳම නව කථාව, කෙටිකථාව, පද්‍ය සංග්‍රහය හා ළමා කෘතිය තේරීමට විනිශ්චය මණ්ඩලය වෙත යොමු කිරීම.

2015 වර්ෂයේ සංස්කෘතික අමාත්‍යාංශය මගින් දීපව්‍යාප්ත මට්ටමින් සංවිධානය කරන ලද හොඳම කෙටිකතා සංග්‍රහය මුද්‍රණය කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් කැඳවූ නිර්මාණ තරගාවලියට නිර්මාණ 237 පමණ ලබා ගෙන ජයග්‍රාහකයින් ජාතික මට්ටමට යොමු කිරීම.

**2015වර්ෂය සඳහා ලේඛක සංගමය මගින් විචාරයට ලක්කරන ලද කෘතීන්**

සෑම මාස තුනකට වරක් මහා සභාව රැස්වන අතර එහිදී කෘතියක් විචාරයකර රසවින්දනයට අවස්ථාව සළසා දෙයි.

| අංකය | කතෘ | කෘතියේ නම | විචාරක |
|---|---|---|---|
| 1 | ආරියරත්න මහතා | හැබැටම මේ මමද | වී. දෙගොල්ලගේ මහතා |
| 2 | නිහාල් වීරසිරි මහතා | ඉස්සර වැස්ස | චින්තක රණසිංහ මහතා |
| 3 | රංජිත් විජේනායක මහතා | කඳුලු මල් | ප්‍රභාත් විජේසිංහ මහතා |

## <u>නව කලායතන ලියාපදිංචි කිරීම</u>

2015 වර්ෂය සඳහා ගම්පහ දිස්ත්‍රික්කය තුළ නව කලායතන 06 ක් ලියාපදිංචි කරන ලදී.

| කලායතනයේ නම | ලියාපදිංචි අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
|---|---|---|
| සත්සලී කලායතනය | ගම් 218 | මීරිගම |
| සුසර කලායතනය | ගම් 219 | ජා ඇල |
| හෙවුඩ් කලායතනය | ගම් 220 | ගම්පහ |
| ආශ්චරි රංග කලායතනය | ගම් 221 | අත්තනගල්ල |
| රොචින්යා කලායතනය | ගම් 222 | අත්තනගල්ල |
| තාලරංග කලායතනය | ගම් 223 | මිනුවන්ගොඩ |
| සොමාට් කලායතනය | ගම් 224 | මිනුවන්ගොඩ |

## 01.22 බෞද්ධ කටයුතු අංශය

සම්බන්ධීකරණය

- බුද්ධ ශාසන අමාත්‍යාංශය
- බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

### දහම් පාසල් ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා සිදුකරන ලද කාර්යයන්

### දහම් පාසල් පෙල පොත් හා අනෙකුත් පොත් බෙදා දීම

2015 වර්ෂයේ දහම් පාසල් පෙල පොත් සහ අනෙකුත් අවශ්‍ය පොත්පත් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක දහම් පාසල් 747 ක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 232,930 කට හා ගුරුවරුන් වෙත බෙදා දීම සඳහා දළ වශයෙන් රු.18,646,463.90 ක (රුපියල් එක් කෝටි අසූහය ලක්ෂ හතළිස්හය දහස් හාරසිය හැටතුනයි ශත අනූවක පමණ) මුදලක් වැය කර ඇත.

### දහම් පාසල් ගුරුභවතුන් වෙනුවෙන් පුස්තකාල දීමනා ලබා දීම

අවම වශයෙන් දහම් පාසලක වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන වයස අවුරුදු 18 සම්පූර්ණ කරන ලද ආදී සුදුසුකම් සපුරා ඇති සියලුම දහම් පාසල් ගුරු භවතුන් වෙනුවෙන්ම එක් ගුරුභවතෙකුට වර්ෂයකට රු. 2000.00 බැගින් වූ පුස්තකාල දීමනාවක් ලබාදීම. ඒ අනුව 2015 වර්ෂයේ දී දහම් පාසල් ගුරුභවතුන් 9,171 ක් වෙනුවෙන් රු.18,342,000.00 (එක්කෝටි අසූතුන් ලක්ෂ හතළිස් දෙදහස)ක මුදලක් ගුරුවරුන්ගේ ගිණුම් වෙත මුදාහරින ලදී. ඊට අමතරව නව රජයේ අයවැය ලේඛනයෙන් වෙන් කරන ලද, මාස 06 ක සේවා කාලය සම්පූර්ණ කරන ලද සියලුම ගුරුභවතුන් සඳහා මාසයකට රු. 200.00 බැගින් 2015 ජුනි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා මාස 06 ක් සඳහා දළ වශයෙන් රු. 1,4,229,600.00 (එක්කෝටි හතළිස් දෙලක්ෂ විසිනව දහස් හයසියය)ක මුදලක් ද ගුරුවරුන්ගේ ගිණුම් වෙත මුදාහරින ලදී.

### දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම

දහම් පාසල් 6 - 10 ශ්‍රේණි සඳහා වර්ෂාවසාන විභාග පැවැත්වීම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් දීප ව්‍යාප්තව සිදු කරනු ලබන අතර, විභාගයෙන් සමත් වන සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත සහතික පත්‍රයක් නිකුත් කිරීම ද සිදු කරනු ලබයි.

| වර්ෂය | මධ්‍යස්ථාන ගණන | සහභාගි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | වියදම් වූ මුදල(දළ වශයෙන්) |
|---|---|---|---|
| 2015 | 881 | 103,080 | රු. 1,030,800.00 |

### දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය

දහම් පාසල් ගුරුවරුන් උදෙසා පවත්වනු ලබන දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය 2015.05.23 දින ගම්පහ යසෝදරාදේවි බාලිකා විද්‍යාලයයේ දී පවත්වනු ලැබූ අතර, මේ සඳහා අපේක්ෂක, අපේක්ෂිකාවන් 650 දෙනෙකු සහභාගි විය.

### දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම් වැඩසටහන

පසුගිය වර්ෂ වල දී මෙන්ම මෙවර ද ප්‍රාදේශීය මණ්ඩල ඇගයීම් සිදු කිරීමෙන් පසු දිස්ත්‍රික් සිසු නිපුණතා ඇගයීම් කටයුතු ගම්පහ බණ්ඩාරනායක මහ විදුහලේ දී 2015.11.25 දින පැවැත්වීමෙන් අනතුරුව තෝරාගනු ලැබූ සිසුන් සමස්ත ලංකා ඇගයීම් නිපුණතා සඳහා ඉදිරිපත් කරන ලදී. මෙවර සමස්ත ලංකා සිසු නිපුණතා ඇගයීම් වැඩසටහන 2015 දෙසැම්බර් මස 25, 26 සහ 27 යන දිනවල අම්පාර ඩී. ඇස්. සේනානායක විදුහලේ දී පැවැති අතර, ගම්පහ දිස්ත්‍රික්කය සමස්ත ලංකා මට්ටමින් තෙවන ස්ථානය ලබාගැනීමට සමත් විය.

### දහම් සරසවිය වැඩසටහන

දහම් පාසල් ගුරුභවතුන්ගේ දැනුම වඩාත් වර්ධනය කර ගැනීමටත් එය තුළින් ඔවුන්ට උසස් අධ්‍යාපනය සඳහා දොරටු විවෘත කර දීමත් අරමුණු කොටගෙන පවත්වන වැඩසටහනකි. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය හා පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයය සමග ඒකාබද්ධව මෙම වැඩසටහන පවත්වනු ලබයි. 2015 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණ පවත්වා තෝරාගනු ලැබූ දහම් පාසල් ගුරුවරුන් 156 දෙනෙකු පාඨමාලාව සඳහා තෝරාගනු ලැබූ අතර, ගම්පහ ජාත්‍යන්තර සාම මහා විහාරස්ථානයේ දී මෙම පාඨමාලාව පවත්වනු ලැබී ය. මෙම පාඨමාලාව 2015 දෙසැම්බර් මස දේශන පවත්වා අවසන් කළ අතර, ඒ සඳහා නියමිත විභාගය 2016 වසරේ අප්‍රේල් හෝ මැයි මාසය තුල දී පැවැත්වීමට නියමිත ය.

### පාලි භාෂා ප්‍රවර්ධන පාඨමාලාව

දහම් පාසල් ගුරු භවතුන් ගේ පාලි භාෂා ඥානය වැඩිදියුණු කිරීම උදෙසා මෙම 2015 වර්ෂයේ දී ද පාලි භාෂා ප්‍රවර්ධන පාඨමාලාව ගම්පහ බැණ්ඩියමුල්ල විද්‍යාශේඛර පිරිවෙන් විහාරස්ථානයේ දී පවත්වා 2015 දෙසැම්බර් මස දී දේශන අවසන් කළ අතර, විභාගය 2016 පෙබරවාරි මස දී පැවැත්වීමට නියමිත ය. මෙම පාඨමාලාව සඳහා රු. 76,420.00 ක පමණ මුදලක් බෞද්ධ කටයුතු දෙපාර්මේන්තුව මගින් වැය කර තිබුණි.

## විහාරස්ථාන සංවර්ධනය සහ පවත්වාගෙනයාම සඳහා සිදුකරන ලද කාර්යයන්

### විහාරස්ථාන ආධාර ලබාදීම

විහාරස්ථාන සඳහා සංවර්ධන ආධාර විවිධ විෂයයන් යටතේ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් ලබාදීම සිදු කරනු ලබයි. ඒ අනුව ගම්පහ දිස්ත්‍රික්කයේ විහාරස්ථාන

සංවර්ධනය සඳහා බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශය මගින් රු.7,351,369.00 (රුපියල් හැත්තෑතුන් ලක්ෂ පනස් එක් දහස් තුන්සිය හැට නවයක) මුදලක් ලබා දී ඇත.

ඊට අමතරව බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් විහාරස්ථාන සංවර්ධන ආධාර හා දුෂ්කර විහාරස්ථාන සංවර්ධන ආධාර වශයෙන් රු. 2,450,000.00 (රුපියල් විසිහතර ලක්ෂ පනස් දහසක)ක මුදලක් ලබා දී ඇති අතර, දහම් පාසල් උපකරණ හා ගොඩනැගිලි සංවර්ධනය සඳහා රු. 100,000.00(රුපියල් ලක්ෂය)ක මුදලක් ද ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල උපකරණ මිල දී ගැනීම සඳහා රු. 632,000.00(රුපියල් හයලක්ෂ තිස් දෙදහස)ක් ද වශයෙන් මුදල් ලබා දී ඇත.

### ආදාහනෝත්සව සඳහා ආධාර ලබාදීම

2015 වර්ෂයේ දී ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩවිසූ අපවත් වූ ස්වාමීන්වහන්සේලාගේ ආදාහන පූජෝත්සව වෙනුවෙන් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව රු. 95,000.00(රුපියල් අනූපන්දහසක) මුදලක් ද වැය දරා ඇත.

## සිදු කරන ලද වෙනත් කාර්යයන්

- **ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා සැමරීම**

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 150 වන ජන්ම දිනය සැමරීම සඳහා දිවයිනේ සියලුම දහම් පාසල් සම්බන්ධ කරගෙන බෝසත් දම්පල් හරසර කථික හා රචනා ඇගයීම් වැඩසටහනක් පවත්වනු ලැබී ය. එය ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා සමස්ත ලංකා නමින් අදියර 3කින් ක්‍රියාත්මක වූ අතර, කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ වශයෙන් අංශ 02 කින් ඇගයීම් පැවත්වුණි. ජයග්‍රාහකයින් සඳහා ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ දී සහතිකපත් පිරිනැමීමටත් සමස්ත ලංකා මට්ටමේ දී වටිනා මුදල් ත්‍යාග සහ සහතිකපත් පිරිනැමීමට යෝජනා වී තිබුණි.

- **තායිලන්ත ලෝක සාම ආචාර ධර්ම තරගය**

තායිලන්තයේ ධම්මකාය පදනම මගින් ලෝකයේ ථෙරවාද බෞද්ධ රටවල් මුල්කරගෙන ලෝක සාම ආචාර ධර්ම තරග විභාගය පවත්වනු ලබයි. මෙම තරග විභාගය සඳහා සිසු දරු දැරියන් සමග ඔවුන් ගේ දෙමව්පියන්ට ද පවුලක් වශයෙන් මෙම විභාගය සඳහා ඉදිරිපත්වීමට හා පිළිතුරු ලිවීමට හැකිවීම මෙම විභාගයේ ඇති විශේෂත්වයයි. මේ සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ ද සිසු දරු දැරියන් 2015 වර්ෂයේ දී මෙම තරග විභාගය සඳහා ඉදිරිපත් විය.

- **ප්‍රධානාචාර්ය හා උප ප්‍රධානාචාර්ය වැඩමුළු**

ප්‍රධානාචාර්ය හා උප ප්‍රධානාචාර්ය පුහුණු වැඩමුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සංවිධානය කර පැවැත් වූ අතර, ඒ සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් රු. 818,800.00 (අටලක්ෂ දහඅට දහස් අටසියයක) මුදලක් වැය දරා තිබුණි.

# 02. පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර අංශය

## මෙම අංශයේ ප්‍රධාන කාර්යයන්

1. මහා පරිමාණ, මධ්‍යම හා කුඩා පරිමාණ වාණිජමය කළුගල් කැණීම් කර්මාන්ත සඳහා පුපුරන ද්‍රව්‍ය ලබා ගැනිම, සන්තකයේ තබා ගැනීම සහ පාවිච්චි කිරීම පිණිස පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍ර නිකුත් කිරීම හා පුපුරන ද්‍රව්‍ය වාරික ලිපි නිකුත් කිරීම.
2. ගෙපලක් කැපීමේදී, ළිඳක් හැරීමේදී, මාර්ගයක් සකස් කර ගැනීමේදී බාධක වන ගල් ඉවත් කිරීම සඳහා පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍ර නිකුත් කිරීම.
3. වාණිජමය කළුගල් කැණීම් කර්මාන්ත සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හෝ මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවත්වනු ලබන පිපුරුම් හා ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා සහභාගි වීම.
4. බලයලත් පුපුරන ද්‍රව්‍ය අලෙවි නියෝජිතයින් සඳහා පුපුරන ද්‍රව්‍ය සපයන්නාගේ බලපත්‍ර නිකුත් කිරීම හා ඔවුන්ගේ තොග ගබඩා, පොත් පත් පරීක්ෂා කිරීම.
5. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍ර නිකුත් කිරීම.
6. ගිනිපෙට්ටි නිෂ්පාදනය සඳහා පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍ර නිකුත් කිරීම.
7. මදුරු දඟර නිෂ්පාදනය සඳහා පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍ර නිකුත් කිරීම.
8. හඳුන්කූරු නිෂ්පාදනය සඳහා පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍ර නිකුත් කිරීම.
9. ගිනිකෙළි භාණ්ඩ නිෂ්පාදනය සඳහා පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදන බලපත්‍ර නිකුත් කිරීම.
10. ගිනිකෙළි භාණ්ඩ නිෂ්පාදනයට අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය පනතට ගැනෙන අමු ද්‍රව්‍යයක් වන පොටෑසියම් නයිට්‍රේට් ලබා ගැනීමට වාරික ලිපි නිකුත් කිරීම.
11. ගිනිකෙළි භාණ්ඩ කර්මාන්තකරුවන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම.
12. ගිනිකෙළි භාණ්ඩ විකිණීම සඳහා පුපුරන ද්‍රව්‍ය සපයන්නාගේ බලපත්‍ර නිකුත් කිරීම.
13. ගිනිකෙළි භාණ්ඩ අපනයනය සඳහා පුපුරන ද්‍රව්‍ය අපනයන බලපත්‍ර නිකුත් කිරීම.
14. වෝටර් ජෙල්, ගල් වෙඩි බෙහෙත් හා සේවා නුල් යන පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදන බලපත්‍ර නිකුත් කිරීම.
15. වෝටර් ජෙල්, ගල් වෙඩි බෙහෙත් හා සේවා නුල් යන පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදන කර්මාන්තශාලාවන්හි නිෂ්පාදන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම හා එම නිෂ්පාදන වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම.
16. වෝටර් ජෙල් පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදනයට අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය පනතට ගැනෙන අමු ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා පුපුරන ද්‍රව්‍ය ආනයන බලපත්‍ර නිකුත් කිරීම.
17. ගල් වෙඩි බෙහෙත් හා සේවා නුල් යන පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදනයට අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය පනතට ගැනෙන අමු ද්‍රව්‍යයක් වන පොටෑසියම් නයිට්‍රේට් ලබා ගැනීමට වාරික ලිපි නිකුත් කිරීම.
18. තීන්ත නිෂ්පාදනයට අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය පනතට ගැනෙන අමු ද්‍රව්‍යයක් වන නයිට්‍රෝ සෙලියුලෝස් ආනයනය කිරීම සඳහා පුපුරන ද්‍රව්‍ය ආනයන බලපත්‍ර නිකුත් කිරීම.
19. රබර් ආශ්‍රිත ග්ලවුස් නිෂ්පාදනයට අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය පනතට ගැනෙන අමු ද්‍රව්‍යයක් වන කැල්සියම් නයිට්‍රේට් ආනයනය කිරීම සඳහා පුපුරන ද්‍රව්‍ය ආනයන බලපත්‍ර නිකුත් කිරීම.
20. ගිනි අවි/තුවක්කු සඳහා පතරොම් නිකුත් කිරීම.
21. කළුගල් කැණීම් කර්මාන්තය සඳහා යොදා ගන්නා පුපුරන ද්‍රව්‍යයක් වන එමල්ෂන් පුපුරන ද්‍රව්‍ය අලුතින් මෙරට තුළ නිෂ්පාදන කිරීම අධීක්ෂණය කිරීම හා එම නිෂ්පාදන වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම.

**2015 වර්ෂය තුළ අවසර පත්‍ර, බලපත්‍ර (වර්ග අනුව) හා අවසර පත්‍ර / බලපත්‍ර ගාස්තු ලෙස ලද ආදායම**

| පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍ර නිකුත් කිරීම | ප්‍රගතිය | |
|---|---|---|
| | භෞතික | මූල්‍ය රු. |
| **1.** මහා පරිමාණ, මධ්‍යම හා කුඩා පරිමාණ වානිජමය කළුගල් කැණීම් කර්මාන්ත සඳහා | 308 | 77,000/- |
| **2.** ගෙපලක් කැපීමේදී, ළිඳක් හෑරීමේදී, මාර්ගයක් සකස් කර ගැනීමේදී බාධක වන ගල් ඉවත් කිරීම සඳහා | 15 | 1,500/- |
| **3.** ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා | 01 | 250/- |
| **4.** ගිනිපෙට්ටි නිෂ්පාදනය සඳහා | 02 | 500/- |
| **5.** මදුරු දඟර නිෂ්පාදනය සඳහා | 02 | 500/- |
| **6.** හඳුන්කූරු නිෂ්පාදනය සඳහා | 01 | 250/- |
| **එකතුව** | **329** | **80,000/-** |

| පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීම | ප්‍රගතිය | |
|---|---|---|
| | භෞතික | මූල්‍ය (රු.) |
| **1.** ගිනිකෙළි භාණ්ඩ නිෂ්පාදනය සඳහා | 141 | 124,000/- |
| **2.** ගිනිකෙළි භාණ්ඩ විකිණීම සඳහා | 226 | 89,750/- |
| **3.** ගිනිකෙළි භාණ්ඩ අපනයනය සඳහා | 01 | 1,000/- |
| **4.** වෝටර් ජෙල්, ගල් වෙඩි බෙහෙත් හා සේවා නූල් යන පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා | 03 | 1,500/- |
| **5.** වෝටර් ජෙල් පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදනයට අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය පනතට ගැනෙන අමු ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා | 01 | 5000/- |
| **6.** තීන්ත නිෂ්පාදනයට අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය පනතට ගැනෙන අමු ද්‍රව්‍යයක් වන නයිට්‍රෝ සෙලියුලෝස් ආනයනය කිරීම සඳහා | 06 | 30,000/- |
| **7.** රබර් ආශ්‍රිත ග්ලවුස් නිෂ්පාදනයට අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය පනතට ගැනෙන අමු ද්‍රව්‍යයක් වන කැල්සියම් නයිට්‍රේට් ආනයනය කිරීම සඳහා | 05 | 25,000/- |
| **8.** බලයලත් පුපුරන ද්‍රව්‍ය අලෙවි නියෝජිතයින් සඳහා | 14 | 28,000/- |
| **එකතුව** | **383** | **304,250/-** |

**2014 වර්ෂය සමඟ සංසන්දනය කිරීමේදී 2015 වර්ෂය තුළ නිකුත් කළ අවසර පත්‍ර හා බලපත්‍ර සංඛ්‍යාව**

| නිකුත් කළ අවසර පත්‍ර හා බලපත්‍ර සංඛ්‍යාව | 2014 වසර | 2015 වසර |
|---|---|---|
| 1. නිකුත් කළ අවසර පත්‍ර සංඛ්‍යාව | 351 | 329 |
| 2. නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | 366 | 383 |




**2014 වර්ෂය සමඟ සංසන්දනය කිරීමේදී 2015 වර්ෂය තුළ නිකුත් කළ අවසර පත්‍ර හා බලපත්‍ර සංඛ්‍යාවට අදාලව ලද ආදායම**

| අවසර පත්‍ර හා බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම | 2014 වසර | 2015 වසර |
|---|---|---|
| 1. අවසර පත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම(රුපියල්) | 81,600/- | 80,000/- |
| 2. බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම(රුපියල්) | 241,500/- | 304,250/- |



## 2015 වර්ෂය තුළ භාවිතා කළ පුපුරන ද්‍රව්‍ය **ප්‍රමාණ ( මහා පරිමාණ කර්මාන්ත සඳහා )**

**ගම්පහ දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන වශයෙන් පුපුරන ද්‍රව්‍ය භාවිතා කර නිෂ්පාදන කර්මාන්ත දෙකකි**

i. කළුගල් නිෂ්පාදනය

ii. ගිනිකෙළි භාණ්ඩ නිෂ්පාදනය

මහා පරිමාණ, මධ්‍යම හා කුඩා පරිමාණ වානිජමය කළුගල් කැණීම් කර්මාන්ත සඳහා 2015 වර්ෂය තුළ භාවිතා කළ පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණ

| | | |
|---|---|---|
| 1. වෝටර් ජෙල් පුපුරන ද්‍රව්‍ය | කිලෝ ග්‍රෑම් | 41,181 |
| 2. ඇමෝනියම් නයිට්‍රේට් | කිලෝ ග්‍රෑම් | 213,512 |
| 3. ගල් වෙඩි බෙහෙත් | කිලෝ ග්‍රෑම් | 1,866 |
| 4. ආරක්ෂිත සේවා නූල් | මීටර් | 630,700 |
| 5. ඩෙටෝනේටර්ස් | අංක | 339,017 |

**ඉහත සඳහන් භාවිතා කළ පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණ වලින්, භූ විද්‍යා හා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිර්ණායකයන්ට අනුව, නිෂ්පාදනය කරන ලද මුළු කළුගල් ප්‍රමාණය කියුබ් 520,000 ක් පමණ වේ.**

ගිනිකෙළි භාණ්ඩ නිෂ්පාදනය සඳහා 2015 වර්ෂය තුළ භාවිතා කළ පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණ

| | | |
|---|---|---|
| 1. පොටෑසියම් නයිට්‍රේට් | කිලෝ ග්‍රෑම් | 395,700 |

**ඉහත සඳහන් භාවිතා කළ පොටෑසියම් නයිට්‍රේට් ප්‍රමාණ වලින්, ආරක්ෂක අමාත්‍යාංශයේ නිර්ණායකයන්ට අනුව, නිෂ්පාදනය කරන ලද ගිනිකෙළි භාණ්ඩ ප්‍රමාණය කි. ග්. 4,000,000 ක් පමණ වේ.**

## පුපුරන ද්‍රව්‍ය භාවිත කරන ප්‍රධාන කර්මාන්තවල නිෂ්පාදනයන්හි වෙළඳ පොලේ වටිනාකම (මහා පරිමාණ කර්මාන්ත සඳහා)

| කර්මාන්තය | වර්ගය | නිෂ්පාදිත ප්‍රමාණය | වටිනාකම රු. මිලියන |
|---|---|---|---|
| කළුගල් (කියුබ්) | 6" X 9" | 156,000 | 374.4 |
| | ¾ " | 104,000 | 572.0 |
| | ABC මිශ්‍රණය | 104,000 | 572.0 |
| | වෙනත් | 156,000 | 624.0 |
| | | එකතුව | **2142.4** |
| ගිනිකෙළි භාණ්ඩ (කිලෝ ග්‍රෑම්) | | 4,000,000 | **4000.0** |
| **එකතුව** | | | **6142.4** |

# 03. දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය

## 03.01 දින 100 විශේෂ සංවර්ධන වැඩසටහනට සමගාමීව ගම් නගා සිටුවීමේ වැඩසටහන

2015 වර්ෂයේදී සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය මගින්, දින 100 විශේෂ සංවර්ධන වැඩසටහනට සමගාමීව ගම් නගා සිටුවීමේ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13 හිම ඇති ග්‍රාම නිලධාරි වසම් 1177 ආවරණය වන පරිදි එක් ග්‍රාම නිලධාරී වසමක් සඳහා රුපියල් මිලියනය බැගින් වෙන් කරන ලද අතර මේ සඳහා ප්‍රජාවගේ කැමැත්ත මත 25% ක අවම ප්‍රජා දායකත්වයක් ද ලබාගන්නා ලදී.

එම වැඩසටහන යටතේ සෑම ග්‍රාම නිලධාරි වසමකම සම්පූර්ණයෙන් වැඩ අවසන් කළ හැකි හා ප්‍රමුඛතාව දියහැකි ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව හඳුනාගත් ව්‍යාපෘති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශය ඇතිව, දිස්ත්‍රික් ලේකම් විසින් අනුමත කරන ලදී. එක් ග්‍රාම නිලධාරි වසමක උපරිම වශයෙන් ව්‍යාපෘති 02ක් ක්‍රියාත්මක කළ අතර ව්‍යාපෘති වල වටිනාකම රුපියල් මිලියන 01 ට වඩා වැඩිවන විටදී ප්‍රජා දායකත්වයෙන් ඉතිරි වැඩ කොටස් සිදු කර තිබුණි.

දින 100 විශේෂ සංවර්ධන වැඩසටහනට සමගාමීව ගම් නගා සිටුවීමේ සංවර්ධන වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 1,177 ප්‍රතිපාදන වෙන් වී ඇත. මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරිමට අනුමත වූ ව්‍යාපෘති සංඛ්‍යාව 1722 ක් විය. මේ සඳහා රජයේ දායකත්වය මිලියන 1177 වූ අතර, ප්‍රජාදායකත්වය මිලියන 45.45 ක් විය. ඒ අනුව අනුමත ව්‍යාපෘති සඳහා මුළු වටිනාකම මිලියන 1222 ක් වේ.

ආංශික වර්ගීකරණයට අනුව වැඩිම ව්‍යාපෘති සංඛ්‍යාවක් ක්‍රියාත්මක වූයේ මාර්ග, පාලම්, සහ බෝක්කු යන සංරචකය තුළයි. එනම් ව්‍යාපෘති 1385ක් ක්‍රියාත්මක වූ අතර එහි මුළු වටිනාකම මිලියන 902ක් විය. සමාජ සුභසාධක සංරචකය තුළ ව්‍යාපෘති 232ක් ක්‍රියාත්මක වූ අතර ඒ මුළු වටිනාකම මිලියන 223ක් විය. සුළු වාරිමාර්ග, ජලසම්පාදනය හා සනීපාරක්ෂාව හා වෙනත් පොදු කටයුතු යන සංරචකයන් සඳහා ද ව්‍යාපෘති සැලකිය යුතු ප්‍රමාණයක් ක්‍රියාත්මක විය. ඒ සඳහා මුළු වටිනාකම මිලියන 76.5 ක් විය.

සමාජ සවිබල ගැන්වීමේ හා සුභසාධක අමාත්‍යාංශයෙන් 2016 වර්ෂය සඳහා ශුන්‍ය පාදක අයවැයක් ක්‍රියාත්මක කිරිමේ උපදෙස් මත මෙම ව්‍යාපෘති කිසිවත් 2016 වර්ෂයට අවිච්ඡේද නොවීය. ඒ අනුව ව්‍යාපෘති 66 ක් අවලංගු වී ව්‍යාපෘති 1652 ක වැඩ අවසන් කරන ලදී. තවද, ව්‍යාපෘති 05ක සම්පූර්ණයෙන් වැඩ අවසන් නොවී කරනු ලැබූ වැඩ කොටස සඳහා පමණක් ගෙවීම් සිදුකල අතර එක් ව්‍යාපෘතියක වැඩ අවසන් කර තිබුණද, නියමිත ප්‍රමිතියට නොතිබීම හේතුවෙන් ගෙවීම් නොකරන ලදී.

2016 වර්ෂය අවසානයේ දින 100 විශේෂ සංවර්ධන වැඩසටහනට සමගාමීව ගම් නගා සිටුවීමේ සංවර්ධන වැඩසටහන සඳහා පරිපාලන වියදමත් සමග මුළු වියදම මිලියන 1074.4ක් වූ අතර අවලංගු වූ ව්‍යාපෘති 66හි මුළු වටිනාකම මිලියන 45.3ක් විය.

**දින 100 විශේෂ සංවර්ධන වැඩසටහනට සමගාමීව ගම් නගා සිටුවීමේ සංවර්ධන වැඩසටහන - 2015 - ආංශික වර්ගීකරණය**

| අනු අංකය | සංරචකය | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු වටිනාකම (රු) | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | ගෙවූ මුළු මුදල (රු) |
|---|---|---|---|---|---|
| 1 | මාර්ග/ පාලම්/ බෝක්කු | 1385 | 922,061,796.79 | 1329 | 812,610,132.93 |
| 2 | සමාජ සුහසාධක (ප්‍රජාසමාජ සුහසාධක (ප්‍රජාශාලා/ බහුකාර්ය ගොඩනැගිලි) | 232 | 223,461,330.70 | 227 | 186,907,237.89 |
| 3 | සුළු වාරි මාර්ග | 45 | 29,873,499.52 | 44 | 27,559,932.41 |
| 4 | ජල සම්පාදන හා සනීපාරක්ෂක | 20 | 13,746,053.14 | 17 | 10,487,715.08 |
| 5 | වෙනත් (උද්‍යාන/පොදු ළිං/ක්‍රීඩා පිටි/සුසාන භූමි) | 40 | 33,280,998.92 | 35 | 26,206,717.44 |
| එකතුව | | 1722 | 1,222,423,679.07 | 1652 | 1,063,771,735.75 |
| පරිපාලන වියදම | | | | | 10,610,205.09 |
| මුළු වියදම | | | | | 1,074,381,940.84 |



**දින 100 විශේෂ සංවර්ධන වැඩසටහනට සමගාමීව ගම් නගාසිටුවීමේ සංවර්ධන වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව ප්‍රගතිය 2015**

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු වටිනාකම (රු) | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | ගෙවූ මුළු මුදල (රු) (පරිපාලන වියදම ද සහිතව) |
|---|---|---|---|---|---|---|
| 1 | දිවුලපිටිය | 123 | 206 | 132,648,435.25 | 176 | 96,989,583.29 |
| 2 | කටාන | 79 | 94 | 92,194,130.64 | 81 | 60,830,476.68 |
| 3 | මිගමුව | 39 | 60 | 39,852,500.00 | 55 | 30,729,752.91 |
| 4 | මීනුවන්ගොඩ | 121 | 228 | 123,500,000.00 | 227 | 116,957,577.02 |
| 5 | මීරිගම | 149 | 241 | 151,625,000.00 | 237 | 141,991,751.90 |
| 6 | අත්තනගල්ල | 151 | 181 | 151,000,000.00 | 179 | 143,896,450.95 |
| 7 | ගම්පහ | 101 | 107 | 102,479,271.00 | 106 | 94,880,814.55 |
| 8 | ජාඇල | 57 | 64 | 67,895,000.00 | 64 | 54,879,627.49 |
| 9 | වත්තල | 46 | 45 | 46,000,000.00 | 45 | 44,024,177.43 |
| 10 | මහර | 92 | 172 | 92,800,000.00 | 167 | 82,978,125.18 |
| 11 | දොම්පෙ | 133 | 203 | 134,032,915.45 | 201 | 126,904,947.06 |
| 12 | බියගම | 49 | 79 | 51,146,426.70 | 76 | 43,478,223.25 |
| 13 | කැලණිය | 37 | 42 | 37,250,000.00 | 42 | 34,340,433.13 |
| 14 | දිස්ත්‍රික් ලේකම් | | | | | 1,500,000.00 |
| **එකතුව** | | **1177** | **1722** | **1,222,423,679.07** | **1656** | **1,074,381,940.84** |



### දින 100 විශේෂ සංවර්ධන වැඩසටහනට සමගාමීව ගම් නගාසිටුවීමේ සංවර්ධන වැඩසටහන යටතේ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 2015

2015 වර්ෂයේ සමාජ සවිබල ගැන්වීමේ හා සුභසාධන අමාත්‍යාංශය මඟින් දින 100 විශේෂ සංවර්ධන වැඩසටහන යටතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ “අංක 28 මිදෙල්ලවල ග්‍රාම නිලධාරී වසමේ වල්බෝලාන පන්සල ඉදිරිපිටින් ඇති මාර්ගයේ පැති බැම්මක් බැඳීම” ව්‍යාපෘතිය සඳහා රු.1,000,000.00 ක මුදලක් ව්‍යාපෘති ගන්වා ක්‍රියාත්මක කරන ලදී.

මෙම වැඩසටහන යටතේ එක් ග්‍රාම නිලධාරී වසමක් සඳහා යෙදවිය හැකි උපරිම මුදල රුපියල් මිලියන 1ක් බැවින්, මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත වටිනාකම වූ රුපියල් මිලියන 2.33 න් ඉතිරි ගම්පහ දිස්ත්‍රික්කය තුළ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන වෙන් කල වැය ශීර්ෂය 123-02-06-2-2105 යටතේ ව්‍යාපෘති ගන්වා ක්‍රියාත්මක කර වැඩ අවසන් කරන ලදී. මේ යටතේ ව්‍යාපෘති ගැන්වූ මුදල රු.1,337,760.65 කි. ඒ සඳහා වියදම් කල මුදල රු.1,334,786.27 ක් වේ.

### 03.02 ග්‍රාමීය ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම - 2015 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

2015 වර්ෂයේ නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය මගින් ග්‍රාමීය ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 01 ක ප්‍රතිපාදන වෙන් කරන ලදී.

දිවයිනේ ග්‍රාමීය ප්‍රදේශ වල ස්ථාපිත කර ඇති මාතෘ සායන මගින් ගර්භනී මාතාවන්ට පහසුකම් ලබා දීම උදෙසා ක්‍රියාත්මක තත්වයේ පවතින මධ්‍යස්ථානවල ජලය, සනීපාරක්ෂක පහසුකම්, විදුලිය වැනි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා අවශ්‍ය සායනික උපකරණ ලබා දීම මෙහි අරමුණ විය.

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ව්‍යාපෘති 03 ක් අනුමත වූ අතර ඉන් එක් ව්‍යාපෘතියක් අවලංගු විය. නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂකගේ බලධාරීත්වයෙන් ඉතිරි ව්‍යාපෘති 02 ක්‍රියාත්මක වූ අතර, මෙහි මුළු වටිනාකම රු. 260,000.00 කි. 2015.12.31 වන විට සම්පූර්ණ ගෙවූ මුදල රු. 224,980.60 කි.

### 03.03 දත්ත හා තොරතුරු

ගම්පහ දිස්ත්‍රික්කයේ දත්ත හා තොරතුරු ඇතුලත් කර දත්ත පද්ධතියක් යාවත්කාලීන කිරීම, දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය විසින් සිදු කරන අතර 2015 වර්ෂයේදී ද එය සිදු කරන ලදී. විශේෂයෙන් ම දිස්ත්‍රික්කයේ විවිධ වූ සංවර්ධන විභවතාවයන් හඳුනාගනිමින් කොට්ඨාස 13ක් ආර්ථික, සමාජ හා සංස්කෘතික සංවර්ධන දත්තයන් පිළිබිඹු කිරීම සිදු කරන අතර දිස්ත්‍රික්කයේ ජනගහනයේ සිට පාංශු තත්වය, පාරිසරික තත්වයන්, ජල මාර්ග, මහා මාර්ග, සෞඛ්‍ය, අධ්‍යාපනය, සංචාරක කටයුතු සහ පරිපාලනයට අදාළ තොරතුරු මෙහි ඇතුලත් විය.

## 03.04 අවිච්ඡේද වැඩසටහන - ගම්පහ දිස්ත්‍රික්කය - 2015

2015 වර්ෂය සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ අවිච්ඡේද ව්‍යාපෘති වෙනුවෙන් රුපියල් මිලියන 720.04 ක මුදලක් වෙන් වූ අතර අවිච්ඡේද ව්‍යාපෘති සංඛ්‍යාව 467 කි . ඉන් ව්‍යාපෘති 433ක් 2015.12.31 වන විට අවසන්ව තිබූ අතර, අවලංගු වූ අවිච්ඡේද ව්‍යාපෘති වල ප්‍රතිපාදන වලින් ගම්පහ දිස්ත්‍රික්කයේ හඳුනාගත් අත්‍යවශ්‍ය ව්‍යාපෘති 22 ක් ක්‍රියාත්මක කරන ලදි.

2015 අවිච්ඡේද ව්‍යාපෘති සඳහා වෙන් වූ ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 588.24 ක මුදලක් වැය කරන ලදි.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | අවිච්ඡේද ලේඛනයෙන් අනුමත මුදල රුපියල් මිලියන | වියදම රුපියල් මිලියන | අවලංගු ,ඉතිරි මුදලින් අනුමත ව්‍යාපෘති සඳහා වියදම රු මි | එකතුව රුපියල් මිලියන |
|---|---|---|---|---|---|---|
| 1 | දිවුලපිටිය | 49 | 43,668,677 | 39,536,659 | 1,001,566 | 40,538,224 |
| 2 | කටාන | 28 | 78,458,142 | 63,792,907 | 3,105,067 | 66,897,974 |
| 3 | මීගමුව | 40 | 27,316,965 | 23,365,382 | 2,905,677 | 26,271,059 |
| 4 | මීනුවන්ගොඩ | 15 | 42,209,257 | 36,698,407 | 2,639,943 | 39,338,350 |
| 5 | මීරිගම | 56 | 25,814,490 | 21,938,333 | 1,537,559 | 23,475,892 |
| 6 | අත්තනගල්ල | 80 | 40,432,335 | 34,592,035 | 4,130,683 | 38,722,719 |
| 7 | ගම්පහ | 39 | 25,288,716 | 20,575,258 | 2,668,369 | 23,243,627 |
| 8 | ජාඇල | 27 | 35,783,105 | 32,574,508 | 4,244,674 | 36,819,182 |
| 9 | වත්තල | 11 | 6,863,097 | 6,463,211 | 3,230,377 | 9,693,589 |
| 10 | මහර | 24 | 12,497,046 | 8,123,005 | 1,742,734 | 9,865,739 |
| 11 | දොම්පේ | 36 | 25,751,472 | 23,920,703 | 4,182,381 | 28,103,084 |
| 12 | බියගම | 24 | 48,379,606 | 47,797,214 | 3,023,002 | 50,820,216 |
| 13 | කැළණිය | 3 | 3,893,825 | 3,367,476 | 3,033,405 | 6,400,880 |
| 14 | දිස්ත්‍රික් ලේකම් | 35 | 304,047,369 | 177,182,299 | 10,870,213 | 188,052,512 |
| **එකතුව** | | **467** | **720,404,101** | **539,927,397** | **48,315,651** | **588,243,048** |



## 03.05 ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම

ගම්පහ දිස්ත්‍රික්කයේ සියලුම සංවර්ධන වැඩසටහන් පිළිබඳව සාකච්ඡා කර මතුවන ගැටළු සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන දිස්ත්‍රික්කයේ ප්‍රධානතම කමිටුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වේ.

දිස්ත්‍රික් සැලසුම් කමිටුව, ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු 13, නිවාස කමිටුව, පරිසර කමිටුව, කෘෂිකර්ම කමිටුව, ධීවර කමිටුව, සමෘද්ධි කමිටුව, මිල කමිටුව, අමා කමිටුව, ශාසනාරක්ෂක බල මණ්ඩලය, දිස්ත්‍රික් වන කමිටුව යන කමිටු 11 කින් මෙම කමිටුව සකස් වී ඇත.

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන්, පළාත් පාලන ආයතන ප්‍රධානීන්, දිස්ත්‍රික්කයේ සියලු රාජ්‍ය ආයතන හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් මෙම කමිටුව සමන්විත වේ. ගම්පහ දිස්ත්‍රික් ලේකම් කමිටුවේ ලේකම් වන අතර දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය කමිටුවේ ලේකම් කාර්යාලය ලෙස කටයුතු කරනු ලබයි.

2015 වසර ප්‍රථම සම්බන්ධීකරණ කමිටු රැස්වීම 2015.04.24 දින මහජන සාමය හා ක්‍රිස්තියානි කටයුතු අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මැතිතුමාගේ හා විශේෂ ව්‍යාපෘති අමාත්‍ය ගරු ෆිලික්ස් පෙරේරා මැතිතුමාගේ සම සභාපතිත්වයෙන් පවත්වන ලදි. දෙවන සම්බන්ධීකරණ කමිටු රැස්වීම නගර සැලසුම්, ජල සම්පාදන රාජ්‍ය අමාත්‍ය ගරු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියගේ හා ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රි ගරු අජිත් මාන්නප්පෙරුම මැති තුමාගේ ප්‍රධානත්වයෙන් 2015.12.22 වන දින පවත්වනු ලැබීය.

## 03.06 ගම්පහ දිස්ත්‍රික් ඒකාබද්ධ වාර්ෂික ක්‍රියාත්මක වැඩසටහන

විවිධ අරමුදල් යටතේ ගම්පහ දිස්ත්‍රික්කයට ලැබෙන මුදල් මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති ඇතුලත් කර මෙම වැඩ සටහන සකස් කරනු ලබයි. මෙම වැඩසටහනේ ප්‍රගතිය කාර්තු අනුව සකස් කරනු ලබන අතර මුදල් ප්‍රභවය, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස හා අංශ අනුව වාර්තා සකස් කෙරේ.

**ආංශික වර්ගීකරණය අනුව ප්‍රතිපාදන බෙදී යාම**

| අනු අංකය | ආංශික වර්ගීකරණය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන රු.මි. | වියදම රු.මි. |
|---|---|---|---|---|
| 1 | කෘෂිකර්මය | 855 | 398 | 326 |
| 2 | කර්මාන්ත, සංචාරක කටයුතු හා වෙළඳාම | 3386 | 248 | 220 |
| 3 | මානව ජනාවාස | 1051 | 480 | 378 |
| 4 | ආර්ථික යටිතල පහසුකම් | 201 | 35 | 32 |
| 5 | ප්‍රවාහන | 4847 | 28170 | 25764 |
| 6 | සමාජ යටිතල පහසුකම් | 2550 | 1953 | 1659 |
| 7 | පරිපාලන පොදු කාර්ය | 371 | 384 | 93 |
| එකතුව | | 13261 | 31667 | 28472 |

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රතිපාදන බෙදී යාම

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන මුදල රුපියල් මිලියන | වියදම රුපියල් මිලියන |
|---|---|---|---|---|
| 1 | දිවුලපිටිය | 771 | 319 | 268 |
| 2 | කටාන | 537 | 1252 | 988 |
| 3 | මීගමුව | 277 | 125 | 131 |
| 4 | මිනුවන්ගොඩ | 948 | 302 | 282 |
| 5 | මීරිගම | 961 | 313 | 296 |
| 6 | අත්තනගල්ල | 1434 | 2813 | 1991 |
| 7 | ගම්පහ | 1226 | 718 | 368 |
| 8 | ජා ඇල | 638 | 301 | 282 |
| 9 | වත්තල | 508 | 250 | 193 |
| 10 | මහර | 782 | 254 | 229 |
| 11 | දොම්පෙ | 1053 | 310 | 309 |
| 12 | බියගම | 481 | 381 | 230 |
| 13 | කැලණිය | 411 | 342 | 334 |
| 14 | පොදු (පළාත් සභා ව්‍යාපෘතිද ඇතුලුව) | 3234 | 23987 | 22570 |
| එකතුව | | 13261 | 31667 | 28472 |

අරමුදල් මූලාශ්‍ර අනුව ප්‍රතිපාදන බෙදී යාම

| අනු අංකය | අරමුදල් ප්‍රභවය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන රුපියල් මිලියන | වියදම රුපියල් මිලියන |
|---|---|---|---|---|
| 1 | විමධ්‍යගත අයවැය | 0 | 0 | 0 |
| 2 | රේඛීය අමාත්‍යාංශ | 718 | 23612 | 21637 |
| 3 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය | 4606 | 3850 | 3470 |
| 4 | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව | 3595 | 82 | 72 |
| 5 | පළාත් සභා | 3075 | 1423 | 1193 |
| 6 | පළාත් පාලන ආයතන | 1248 | 896 | 463 |
| 7 | විදේශ ආධාර හා විශේෂ ව්‍යාපෘති | 3 | 1704 | 1592 |
| 8 | ව්‍යවස්ථාපිත මණ්ඩල | 16 | 102 | 45 |
| එකතුව | | 13261 | 31667 | 28472 |

# 04. දිස්ත්‍රික් දිවිනැගුම කාර්යාලය

## 04.01 දිවිනැගුම වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක වු ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

දිවිනැගුම වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක වු ජීවනෝපාය සංවර්ධන වැඩසටහන වැය ශිර්ෂ 02ක් යටතේ ක්‍රියාත්මක විය. 123-02-06-1-1501 දරන වැය ශිර්ෂය යටතේ කෘෂි සංවර්ධන ව්‍යාපෘති 59 ක් සඳහා රුපියල් මිලියන 1.00 ක්ද සත්ත්ව පාලන ව්‍යාපෘති 43 ක් සඳහා රුපියල් මිලියන 1.09 ක්ද ධිවර සංවර්ධන ව්‍යාපෘති 3ක් සඳහා රුපියල් මිලියන 0.13ක්ද කර්මාන්ත ව්‍යාපෘති 942 ක් සඳහා රුපියල් මිලියන 20.77 ක් හා වෘත්තීය පුහුණු 3ක් සඳහා රුපියල් මිලියන 0.093 ක් වැය කරන ලදි. ඒ අනුව ව්‍යාපෘති 1050 ක් සඳහා දරන ලද මුළු වියදම රුපියල් මිලියන 23.29 කි. (ආකෘති පත්‍ර 01 )

331-2-2-2-2502 දරන වැය ශිර්ෂය යටතේ කෘෂි සංවර්ධන ව්‍යාපෘති 148 ක් සඳහා රුපියල් මිලියන 2.096 ක් ද සත්ත්ව පාලන ව්‍යාපෘති 35 ක් සඳහා රුපියල් මිලියන 0.56ක් ද ධිවර සංවර්ධන ව්‍යාපෘති 22ක් සඳහා රුපියල් මිලියන 0.0.63ක්ද කර්මාන්ත ව්‍යාපෘති 1,849 ක් සඳහා රුපියල් මිලියන 28.29 ක් හා වෘත්තීය පුහුණු 8ක් සඳහා රුපියල් මිලියන 0.19 ක් ද වැය කරන ලදි. ඒ අනුව ව්‍යාපෘති 2060 ක් සඳහා දරන ලද මුළු වියදම රුපියල් මිලියන 32.09 කි. (ආකෘති පත්‍ර 02 )

2014 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ජීවනෝපාය සංවර්ධන වැඩසටහනේ කෘෂි සංවර්ධන ව්‍යාපෘති 252 ක් සඳහා රුපියල් මිලියන 3.62ක්ද පශු සංවර්ධන ව්‍යාපෘති 103 ක් සඳහා රුපියල් මිලියන 2.65 ක්ද ධිවර සංවර්ධන ව්‍යාපෘති 46ක් සඳහා රුපියල් මිලියන 1.19 ක්ද කර්මාන්ත ව්‍යාපෘති 861 ක් සඳහා රුපියල් මිලියන 18.96 ක් හා අලෙවි සංවර්ධන ව්‍යාපෘති 462ක් සඳහා රුපියල් මිලියන 6.72ක් ලෙස 2015 වර්ෂයේ දී අතැති බිල්පත් වශයෙන් ගෙවන ලදි. ඒ අනුව පරිපාලන වියදම ඇතුලුව ව්‍යාපෘති 1,724ක් සඳහා මුළු වියදම රුපියල් මිලියන 33.87කි. (ආකෘති පත්‍ර 03 )

අලෙවි සංවර්ධන වැඩසටහනට අදාලව ජංගම රථ හා කුටි ලබාදිම, පුහුණු වැඩසටහන් පැවැත්වීම හා වෙළඳ ප්‍රදර්ශන යටතේ වැඩසටහන් 30 ක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා රුපියල් මිලියන 1.89ක් වැය කරන ලදි. (ආකෘති පත්‍ර 04 )

## 04.02 දිරිය පියස නිවාස වැඩසටහන

2015 වර්ෂයේදී දිරිය පියස නිවාස වැඩසටහන යටතේ නිවාස 198 ක් සඳහා රුපියල් මිලියන 14.85 ක මුදලක් අමාත්‍යාංශ ප්‍රතිපාදන ලෙස ලබාදුන් අතර ප්‍රතිලාභී දායක්තවය සමඟ නිවාස වල නිමි වටිනාකම රුපියල් මිලියන 36.80කි. (ආකෘති අංක 05)

විශේෂ දිරිය පියස නිවාස වැඩසටහන යටතේ නිවාස 24 ක් සඳහා රුපියල් මිලියන 1.80 ක් මුදලක් වැය කරන ලදි. (ආකෘති අංක 06)

සමාජ සංවර්ධන වැඩසටහන යටතේ 2015 මැයි 31 දින පවත්වන ලද දුම්වැටි විරෝධි කොඩි දින ආදායම රුපියල් මිලියන 12.39 කි. සිසු දිරිය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ කැපකරු මාපිය ශිෂ්‍යත්ව 1,123 ක් ලබාදුන් අතර, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන මඟින් පුද්ගලයින් 343 ක් මත්ද්‍රව්‍ය භාවිතයෙන් මුදවා ගන්නා ලදී. මීට අමතරව සතුටු පවුල වැඩසටහන් 56ක්ද, ළමා සුභසාධන වැඩසටහන් 192ක්ද මෙම වසර තුළදී ක්‍රියාත්මක කරන ලදි. (ආකෘති අංක 07)

## 04.03 දිවිනැගුම වැඩසටහන 2015

| සංවර්ධන ව්‍යාපෘති | | |
|---|---|---|
| වැඩසටහන | ව්‍යාපෘති ගණන | මුදල (රු.මි ) |
| ජීවනෝපාය සංවර්ධන වැඩසටහන (වැය ශිර්ෂය 123-02-06-1-1501) | 1,050 | 23.29 |
| ජීවනෝපාය සංවර්ධන වැඩසටහන (වැය ශිර්ෂය 331-2-2-2-2502) | 2,062 | 32.09 |
| 2014 වර්ෂයේ අතැති බිල්පත් සඳහා ගෙවීම් | 1,724 | 33.87 |
| අලෙවි සංවර්ධන වැඩසටහන | 30 | 1.29 |
| දිරිය පියස නිවාස වැඩසටහන | 198 | 14.85 |
| විශේෂ දිරිය පියස නිවාස වැඩසටහන | 24 | 1.80 |
| **එකතුව** | **5,088** | **107.19** |

| සමාජ ආරක්ෂණ / සිප්දොර ශිෂ්‍යත්ව | | |
|---|---|---|
| ප්‍රතිලාභ ගෙවීම | සංඛ්‍යාව | ගෙවූ මුදල ( රු.මි ) |
| මරණ | 2,120 | 21.20 |
| උපත් | 389 | 1.95 |
| රෝහල් | 1,993 | 5.94 |
| විවාහ | 1,829 | 9.14 |
| **එකතුව** | **6,331** | **38.23** |
| සිප්දොර ශිෂ්‍යත්ව | 1,000 | 12.00 |

| සමෘද්ධි සහනාධාර / පෝෂණ වැඩසටහන | | |
|---|---|---|
| වැඩසටහන | ප්‍රතිලාභ ලැබූ පවුල් සංඛ්‍යාව | වැය කල මුදල (රු. මි.) වාර්ෂික |
| සමෘද්ධි සහනාධාර | 116,245 | 3,349.64 |
| පෝෂණ වැඩසටහන | 4,684 | 2.34 |

## 04.04 සමෘද්ධි බැංකු වැඩසටහන

| | |
|---|---|
| දිවිනැගුම ප්‍රජාමූල සමිති | 13 |
| දිවිනැගුම ප්‍රජාමූල බැංකු | 86 |
| බැංකු සාමාජික සංඛ්‍යාව | 340,880 |
| දිවිනැගුම කුඩා කණ්ඩායම් සංඛ්‍යාව | 40,568 |
| දිවිනැගුම කොටස් හිමියන් සංඛ්‍යාව | 347,198 |

| දිවිනැගුම බැංකු වැඩසටහන (2015.12.31 දක්වා සමුච්ඡිත) | | |
|---|---|---|
| වැඩසටහන | සංඛ්‍යාව | මුදල (රු මිලියන ) |
| තැන්පතු ( සමුච්ඡිත ) | 1,207,779 | 7,698.84 |
| ණය නිකුත් කිරීම් (2015 වර්ෂය තුළ) | 62,788 | 2,592.14 |
| ආයෝජන | | 5,580.81 |
| දිවිනැගුම බැංකු සංගම් ලාභය | | 23.59 |
| දිවිනැගුම ප්‍රජා මූල සමිති ලාභය | | 22.54 |

<u>බැංකු වැඩසටහන</u>

දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු සංගම් 86 මගින් ප්‍රතිලාභීන්ගේ තැන්පතු ඒකරාශීකරණය හා ණය ලබාදීම සිදු කරන ලද අතර 2015.12.31 දින වන විට සමෘද්ධි බැංකු සංගම් සතු මුළු තැන්පතු මුදල රුපියල් මිලියන 7,698.84 කි. 2015 වර්ෂය තුළ සමෘද්ධි බැංකු සංගම් මඟින් නිකුත් කල ණය සංඛ්‍යාව 62,788 ක් වන අතර මුදල රුපියල් මිලියන 2,592.14 කි. 2015.12.31 දිනට සමෘද්ධි බැංකු සංගම් මඟින් රාජ්‍ය බැංකු වල ආයෝජනය කල මුදල රුපියල් මිලියන 5,580.81 කි. තවද 2015 වර්ෂය තුළ සමෘද්ධි බැංකු සංගම් සහ මහා සංගම් උපයා ගත් ලාභය රුපියල් මිලියන 46.13කි.

<u>සමෘද්ධි සහනාධාර / සමාජ ආරක්ෂන හා පෝෂණ වැඩසටහන</u>

මෙම වසරේදි සමෘද්ධි සහනාධාර වැඩසටහන සඳහා රුපියල් මිලියන 3,349.64 ක් ද සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සඳහා රුපියල් මිලියන 50.23ක් වැය කරන ලදි. මීට අමතරව පෝෂණ වැඩසටහන සඳහා රුපියල් මිලියන 2.34 ක් වැය කරන ලදී.

(ආකෘති අංක 08, 09 සහ 10 )

<u>කාර්ය මණ්ඩලය</u>

<u>දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව</u>

| | | |
|---|---|---|
| දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ | - | 01 |
| දිවිනැගුම සම්බන්ධීකරණ නිලධාරි | - | 01 |
| දිවිනැගුම කළමනාකරු | - | 120 |
| දිවිනැගුම කළමනාකරු (විගණන) | - | 06 |
| අධීක්ෂණ කළමණාකරු | - | 05 |
| ප්‍රවර්ධන නිලධාරි | - | 02 |
| විගණන නිලධාරි | - | 03 |
| අධික්ෂණ නිලධාරි | - | 02 |
| දිවිනැගුම සංවර්ධන නිලධාරි | - | 1,488 |
| කළමනාකරණ සහකාර | - | 19 |
| රියදුරු/කාර්යාල කාර්ය සහායක | - | 03 |
| | - | 1,650 |

ආකෘති අංක : 01

## ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2015

## 2015.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය (වැය ශීර්ෂය 123-02-06-1-1501)

ගම්පහ දිස්ත්‍රික්කය

| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කෘෂි | | සත්ත්ව පාලන | | ධීවර | | කර්මාන්ත | | වෘත්තීය පුහුණු | | එකතුව | | පරිපාලන වියදම (රු.) | මුළු එකතුව (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | මුදල (රු.) | සංඛ්‍යාව | මුදල (රු.) | සංඛ්‍යාව | මුදල (රු.) | සංඛ්‍යාව | මුදල (රු.) | සංඛ්‍යාව | මුදල (රු.) | සංඛ්‍යාව | මුදල (රු.) | | |
| 1 | අත්තනගල්ල | 3 | 35,600 | 0 | 0 | 0 | 0 | 62 | 1,485,777 | 0 | 0 | 65 | 1,521,377 | 12,171 | 1,533,548 |
| 2 | බියගම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 28 | 517,202 | 1 | 18,270 | 29 | 535,472 | 4,268 | 539,740 |
| 3 | දිවුලපිටිය | 0 | 0 | 11 | 445,250 | 0 | 0 | 55 | 1,720,745 | 0 | 0 | 66 | 2,165,995 | 15,080 | 2,181,075 |
| 4 | දොම්පේ | 12 | 139,153 | 19 | 236,655 | 0 | 0 | 145 | 2,894,199 | 0 | 0 | 176 | 3,270,008 | 26,032 | 3,296,040 |
